# ප්‍රගති වාර්තාව
# 2023

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය



## ගරු කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගේ පණිවුඩය

සමාජ, ආර්ථික පුනර්ජීවනය තහවුරු කිරීම සඳහා රජය සතු වගකීම ඉටුකිරීම කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයට පැවරී තිබේ.

සමාජයේ ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම් එනම් ආබාධ සහිත පුද්ගලයන්, වැඩිහිටි තැනැත්තන්, අඩු ආදායම්ලාභී පවුල්, මානසික ව්‍යාකූලතාවයන්ට පත්වූ පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණය සැලසීම හා අඩු ආදායම්ලාභී පවුල් මිලියන 1.2ක් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම අමාත්‍යාංශයේ එක් ප්‍රධාන කාර්යභාරයක් වේ.

එමෙන්ම නවීන ලෝකයේ අවශ්‍යතාවයන්ට හා ඉදිරි ගමනට ගැළපෙන අයුරින් 33%ක් පමණ වන අවුරුදු 18ට අඩු ළමුන් ඵලදායී ළමා පරපුරක් ලෙස ගොඩනැඟීම සඳහා වැඩසටහන් දියත් කිරීම අමාත්‍යාංශය වෙත පැවරී ඇති තවත් වගකීමකි.

තවද, ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 52%ක් පමණ වන කාන්තාවන්ගේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු කරමින් ඔවුන්ගේ වත්මන් සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම මෙන්ම කාන්තා හිංසනය වැළැක්වීම හා වින්දිත කාන්තාවන්ගේ සුබසාධනය හා සංවර්ධනය තහවුරු කිරීමේ කාර්යභාරය පැවරී ඇත්තේ ද මෙම අමාත්‍යාංශයටයි.

මෙම ඉලක්කගත ප්‍රජාව වෙනුවෙන් සේවා සැපයීම සඳහා කැපවීමෙන් කටයුතු කරන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතන සහ සියලු අංශවල කාර්යභාරය ඇගයීමට ද මම මෙය අවස්ථාවක් කර ගන්නා අතරම මෙම කටයුතුවලදී සක්‍රීය ලෙස මා හට සහයෝගය ලබාදෙන කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමියටත්, සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශ ලේකම්වරු, ආයතන ප්‍රධානීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

**රනිල් වික්‍රමසිංහ**
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය



## ගරු කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමියගේ පණිවුඩය

කාන්තාවන් හා ළමුන් වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටුකළ 2023 වර්ෂයේ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ප්‍රගතිය හා කාර්යසාධන වාර්තාවට පණිවුඩයක් ලබාදීමට ලැබීම සතුටට කරුණකි. වෙනත් වසරවලට වඩා ළමුන්ට, කාන්තාවන්ට හිතකර තීන්දු තීරණ, නීති, අණපනත්, දිගු කාලීන සැලසුම් සම්පාදනයට, ඉහලම මැදිහත්වීමක් දැරූ වසරකි 2023. මෙහිදී අතිගරු ජනාධිපතිතුමන් වෙතින් ලැබුණු නායකත්වය අතිශයින් පැසසුම්දායකය.

එමෙන්ම පවතින ගෝලීය ආර්ථිකයේ පීඩාකාරී වටපිටාව හා වාතාවරණය තුල වුවත් ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට කාන්තා හා ළමා අංශයට වැඩිම ප්‍රතිපාදන වෙන්වූයේ මෙම වසරේ වන අතර, එය රු. මිලියන 14,829 (සංවර්ධන හා සුබසාධන වැඩසටහන් සඳහා) කි. රජයේ මෙම ප්‍රතිපාදන වලට අමතරව එක්සත් ජාතීන්ගේ සංවිධාන, විවිධ දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන හා දේශීය ව්‍යාපාරික ප්‍රජාවන්ගේ ද අඛණ්ඩ සහයෝගය මත දරුවන් හා කාන්තාවන්ගේ උන්නතිය වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටුකිරීමට අපට හැකිවිය.

අනාථ, අත්හල, අසරණ ළමුන් හා ප්‍රජාව වෙනුවෙන් හා විපතට පත් සියලු කණ්ඩායම් මෙන්ම දැඩි අවදානම් සහිත ප්‍රජාව වෙනුවෙන් ද කැපවුණු සේවාවන් රැසක් ඉටුකල වර්ෂයක් බව සිහිපත් කළ යුතුය. තවද, කාන්තාව, සාමය හා ආරක්ෂාව, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසන වැළැක්වීම වැනි දීර්ඝකාලීන සැලසුම් හරහා ඉටු කළ යුතු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම ළමුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් සකස් කෙරෙන දීර්ඝකාලීන සැලසුම්වල ඉදිරි පියවරයන් ගැනීම ද අප සැම සාමූහිකව ඉදිරියේ දී ඉටු කළ යුතු කාර්යයන් වන්නේය.

තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන හා ළමා සංවර්ධන මධ්‍යස්ථාන යාන්ත්‍රණය යහපත්ව හා ඵලදායීව පවත්වාගෙන යාමට ඒවායේ භෞතික හා යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම, ගුණාත්මක සේවාවක් වෙනුවෙන් මානව සම්පත සංවර්ධනයට අවශ්‍ය කාර්යයන් රැසක් ද අපට ඉටුකළ හැකිවිය.

රටේ ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් ළමුන් හා කාන්තාවන්ය. ඔවුනට සුරක්ෂිත, ආරක්ෂාකාරී ජීවන තත්ත්වයක් ළඟාකර දීමේ ජාතික යාන්ත්‍රණයේ නියමුවන් ලෙස කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය නිරතුරුව ඇප කැපව කටයුතු කරන අතර, ඒ සඳහා ඔබ සැමගේ සහාය හා ක්‍රියාකාරී දායකත්වය බෙහෙවින් අපේක්ෂා කරන්නෙමු.

**කලා කීර්ති ගීතා සමන්මලී කුමාරසිංහ**
කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය



## ගරු සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය

ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් තුලින් සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීම සඳහා ප්‍රජාව සවිබලගැන්වීම මෙන්ම ආන්තීකරණයට ලක් වූ හා අවාසි සහගත තත්ත්වයන්හි සිටින ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් පිහිටුවා ඇති මෙම අමාත්‍යාංශය හරහා සංවර්ධන වැඩසටහන් රැසක් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට ලැබීම පිළිබඳව සතුටට පත්වෙමි.

අඩු ආදායම්ලාභීන්, ආබාධ සහිත පුද්ගලයින් මෙන්ම විශේෂ සහන අවැසි ප්‍රජාව ආර්ථික හා සාමාජීය ලෙස සවිබලගැන්වීම කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම් අංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යයකි. වර්තමානයේ දී , "අස්වැසුම" සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ හඳුනාගෙන ඇති පවුල් මිලියන 1.2 ක දූප්පත් හා අන්ත දූප්පත් යන පවුල්වල ආර්ථික හා සමාජීය ගැටලු නිවැරැදිව හඳුනාගෙන එම ගැටළු වලට වඩාත්ම සුදුසු යෝජනාවන් සකස් කර සියලුම සහාය සේවාවන් සපයන ආයතන සම්බන්ධ කර සැලසුම්කරන ලද වසර 03 ක කාලයක් තුළ එම පවුල් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබලගැන්වීම සිදු කිරීම ප්‍රධාන අරමුණක් වී ඇත.

එමෙන්ම සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ගෘහ ආර්ථික නිෂ්පාදන ප්‍රවර්ධනය කරමින් ග්‍රාමීය ආර්ථිකය ගොඩනැගීමට දායකවීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට අපේක්ෂා කරනු ලබයි.

තවද ආබාධ සහිත තැනැත්තන්ගේ හා වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය, පුද්ගල පෞරුෂ සංවර්ධනය තුලින් ආර්ථිකය සවිබලගැන්වීම උදෙසා ප්‍රජාව මානසික ලෙස සවිමත් කිරීම අපගේ ප්‍රධාන අරමුණු වේ.

දැනට විශ්‍රාම වැටුපක් නොලබන ජනතාව සඳහා නව දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රම ප්‍රවර්ධනය හා සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමාජ වැඩ හා සමාජ සංවර්ධනය හා සුභසාධනයට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම, ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටු දැකීමේ ක්‍රමෝපායන් පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීම් සිදු කිරීම සඳහා වූ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද අප අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි.

උක්ත ආකාරයෙන් අපගේ ඉලක්කගත කණ්ඩායම් වෙත සේවා සැපයීම සිදුකරනු ලබන්නේ හුදෙක් සුභසාධනය සඳහා පමණක් නොව සුළු පරිමාණ ව්‍යවසායකයින් බිහිකිරීම සඳහා කරනු ලබන ආයෝජන ක්‍රියාවලියක් වශයෙන් බවද වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

මේ ආකාරයට ආර්ථික අර්බුදය හමුවේ දැඩි බලපෑමකට ලක් වි ඇති ජන ජීවිතය යථාවත් කිරීම, ජාතික ආර්ථිකය ඉහල නැංවීමත් උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නිසි මඟ පෙන්වීම ලබා දෙන අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් ඒ සඳහා ඇප කැපවී කටයුතු කරන අමාත්‍යාංශ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තූතිය මෙයින් පුද කර සිටිමි.

**අනුප පස්කුවල්**
සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍ය



## කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම්තුමියගේ පණිවුඩය

2024 පාර්ලිමේන්තු අයවැය විවාදය සඳහා ඉදිරිපත් කෙරෙන කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ 2023 වර්ෂයේ ප්‍රගතිය හා කාර්ය සාධනය සඳහා අමාත්‍යාංශ ලේකම් වශයෙන් පණිවුඩයක් ලබා දීමට ලැබීම අගය කරමි. වෙනත් වර්ෂයන්ට සාපේක්ෂව අභියෝග රැසක් මැද ආරම්භ වූ මෙම 2023 වර්ෂය තුළ ළමුන්, කාන්තාවන්, ආබාධ සහිත තැනැත්තන්, වැඩිහිටියන් හා දිළිඳු ප්‍රජාව සම්බන්ධයෙන් සුබදායක තීන්දු තීරණ රැසක් ගැනීමට හැකිවිය. එහිදී රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ආර්ථික ස්ථායීතාව තහවුරු කරමින් ජන ජීවිත යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඉතා කාලෝචිත හා ඵලදායී කාර්යයන් රැසක් ආරම්භ කිරීම සඳහා නායකත්වය ලබා දීමට අමාත්‍යාංශයට හැකියාව ලැබී ඇත.

මෙම අමාත්‍යාංශයට අමාත්‍යාංශය යටතේ වන ආයතන 14ක් සම්බන්ධ කරගනිමින් සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාවට නැංවීමට හැකියාව ලැබිණි. ළමුන් හා කාන්තාවන්ගේ ආරක්ෂාව, රැකවරණය සම්බන්ධයෙන් වැදගත් නෛතික ප්‍රතිපත්ති, ක්‍රියාකාරී සැලසුම් හා මෙහෙයුම් ක්‍රමවේදයන් රැසක් හඳුන්වා දීමට මෙම වසරේදී ඉඩකඩ ලැබිණි. තවද, අඩු ආදායම්ලාභී ආන්තික ප්‍රජාව වෙනුවෙන් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතීන්, සුළු හා මධ්‍ය පරිමාණ මූල්‍ය ණය ව්‍යාපෘතීන් හා දායකත්ව විශ්‍රාම වැටුප් ප්‍රවර්ධන වැඩසටහන් ගණනාවක් සාර්ථකව ක්‍රියාවට නැංවීමට මෙන්ම කාන්තාවන්ගේ ආරක්ෂාව රැකවරණය වෙනුවෙන් සපයන සේවාවන් ප්‍රවර්ධනය කිරීම අමාත්‍යාංශයට හැකිවීම විශේෂයෙන්ම අගය කළ යුතු වේ.

රජයේ ප්‍රතිපාදන මනාව හසුරුවා ගනිමින් රාජ්‍ය වියදම් කළමනාකරණය කරගනිමින් රාජ්‍ය නොවන හා ජාත්‍යන්තර පාර්ශවකාර ආයතනවල ද දායකත්වය ඇතිව ඉතා වැදගත් කාර්යයන් රාශියක් ඉටු කර ගැනීමට හැකිවිය. එහිදී නවීන තාක්ෂණය යොදා ගනිමින් මහජනතාවට සපයන සේවාවන් විධිමත් කිරීම සඳහා පියවර ගන්නා ලදි. තවද, ඒකාබද්ධ ප්‍රවේශයකින් යුතුව ජාතික තලයේ සිට බිම් මට්ටමට සියළු සංවර්ධනයේ ප්‍රතිලාභ ගලායාමට සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම මෙම වසරේදී ආරම්භ කළ වඩාත්ම වැදගත් කර්තව්‍යයක් වන අතර, 2024 වර්ෂයේදී ද ඒ සම්බන්ධයෙන් විශාල කාර්යභාරයන් රැසක් ද ඉටු කළ යුතුව පවතී.

ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් විහිදි අමාත්‍යාංශයේ ඉතා විශාල මානව සම්පත විවිධ වූ දිශානතීන් හා මානයන් ඔස්සේ පවත්වන ලද පුහුණු, දැනුවත් කිරීම් හා සවිබලගැන්වීමේ වැඩසටහන් තුළින් ගුණාත්මක ධාරිතා සංවර්ධනයක් ඇති කිරීම සඳහා කටයුතු කිරීමට හැකිවීම ද විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

අවසන් වශයෙන්, අමාත්‍යාංශයේ සියළු අංශ ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්යමණ්ඩලය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ නියුතු නිලධාරීන් 2023 වසරේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ලබා දුන් ප්‍රසංසනීය දායකත්වය අගය කරන අතර 2024 වසරේදීත් එවැනිම සහයෝගයක් ලබා දෙනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වෙමි.

**යමුනා පෙරේරා**
ලේකම්

# පටුන


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 01 | අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 1 |
| 02 | හැඳින්වීම, කාර්යයන් හා කර්තව්‍යයන් | 3 – 4 |
| 03 | සේවක කළමනාකරණය | 5 |
| 04 | අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය | 6 |
| 05 | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය සඳහා නෛතික විධි විධාන ශක්තිමත් කිරීම පිළිබඳ සාරාංශය | 7 – 8 |
| 06 | අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ආයතන ක්‍රියාත්මක වී ඇති ආකාරය | |
| 6.1 | සංවර්ධන අංශය (කාන්තා හා ළමා කටයුතු අංශය) | 9 – 11 |
| 6.2 | සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය (කාන්තා හා ළමා කටයුතු අංශය) | 12 – 13 |
| 6.3 | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය | 14 -16 |
| 6.4 | මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය | 17 |
| 6.5 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 18 – 22 |
| 6.6 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 23 – 26 |
| 6.7 | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය | 27 – 30 |
| 6.8 | ජාතික කාන්තා කමිටුව | 31 – 32 |
| 6.9 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD) | 33 – 35 |
| 6.10 | සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS) | 36 – 38 |
| 6.11 | සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB) | 39 |
| 6.12 | ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSPD) | 40 – 41 |
| 6.13 | වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSE) | 42 – 43 |
| 6.14 | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB) | 44 – 45 |
| 6.15 | ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD) | 46 – 47 |
| 6.16 | ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI) | 48 – 49 |
| 6.17 | උපදේශන අංශය | 50 – 51 |
| 6.18 | අනෙකුත් මෙහෙයුම් අංශ | 52 – 53 |
| 6.19 | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව වැඩසටහන් හා ව්‍යාපෘති | 54 |

# 01 - අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

## දැක්ම

**සංවර්ධනයේ පූර්ණ ප්‍රතිලාභ සාධාරණව හා සමානව භුක්ති විඳින සමෘද්ධිමත් සමාජයක්**

## මෙහෙවර

**ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන් ද සැලකිල්ලට ගනිමින් ආර්ථික සවිබලගැන්වීම, කාන්තාවන්, ළමුන්, අවදානමට ලක්විය හැකි හා වරප්‍රසාද නොලබන පුද්ගලයන්ගේ සමාජ ආරක්ෂණය සඳහා අවශ්‍ය නෛතික, ආයතනික හා මානව සම්පත් සේවා සැපයීම හා වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.**

# 02 - හැඳින්වීම, කාර්යයන් හා කර්තව්‍යයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2289/43 හා 2022.07.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ස්ථාපිත විය. මෙම අමාත්‍යාංශය කාන්තා හා ළමා කටයුතු අංශය සහ සමාජ සවිබලගැන්වීම් අංශය යන අංශ දෙක යටතේ ක්‍රියාත්මක වේ.

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් විෂයන්ට සහ අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතටපත් කාන්තාවන් සවිබලගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වළක්වාලීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- කාන්තා මූලික ගෘහ ඒකක සවිබලගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- කාන්තා හා ළමා කටයුතු වලට අදාළ තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉටුකරගැනීම.
- පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම.
- අනාරක්ෂිත තත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම.
- සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

- සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූලාධාර සැපයීම.
- සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකරදීම.
- මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා හා තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබා දීම.
- පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහනය හා එක්ව කටයුතු කිරීමට හැකි වන සේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම.

ඉහත කාර්යය හා කර්තව්‍යයන් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ඉටුකරගැනීම සඳහා පහත සඳහන් දෙපාර්තමේන්තු, ආයතන හා අංශ සක්‍රීයව ක්‍රියාත්මක වේ.

i. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
ii. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)
iii. සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)
iv. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
v. කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව
vi. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය (NSPD)
vii. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය (NSE)
viii. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)
ix. ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)
x. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
xi. මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය
xii. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
xiii. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)
xiv. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)
xv. උපදේශන අංශය

තවද ඉහත ආයතන සඳහා අවශ්‍ය පරිපාලන හා මෙහෙයුම් සහය ලබාදීමට ආයතන අංශය, ගිණුම් අංශය, සංවර්ධන අංශය, අභ්‍යන්තර විගණන අංශය සහ සැලසුම් හා මෙහෙයුම් අංශය ක්‍රියාත්මක වේ.

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු, ආයතන, අංශ හා ව්‍යාපෘති පිළිබඳවත් 2023 වර්ෂයට අදාළව අනුමත වී ඇති ප්‍රතිපාදන පිළිබඳවත් 2023.09.30 දක්වා ලබාගෙන ඇති මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු මෙම වාර්තාව තුළ අන්තර්ගත වේ.

# 03 - සේවක කළමනාකරණය

| ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු/අතිරික්ත සංඛ්‍යාව |
| **කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය** | | | | | | | | | | | |
| කාන්තා හා ළමා කටයුතු අංශය | 26 | 21 | 16 | 12 | 1019 | 956 | 70 | 51 | 1131 | 1040 | 91 |
| සමාජ සවිබලගැන්වීම් අංශය | 26 | 18 | 3 | 4 | 438 | 511 | 44 | 38 | 511 | 571 | 60 |
| **දෙපාර්තමේන්තු/ ආයතන/ අංශ** | | | | | | | | | | | |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 08 | 06 | 224 | 220 | 253 | 236 | 17 | 13 | 502 | 475 | 27 |
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 108 | 81 | 1942 | 1560 | 25509 | 22279 | 516 | 440 | 28075 | 24360 | 3715 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 9 | 8 | 492 | 246 | 857 | 636 | 161 | 106 | 1519 | 996 | 523 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 18 | 14 | 17 | 08 | 570 | 297 | 13 | 07 | 618 | 326 | 292 |
| ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය | 06 | 05 | 03 | 03 | 25 | 42 | 06 | 02 | 40 | 52 | 12 |
| ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය | 7 | 3 | 1 | 1 | 115 | 106 | 20 | 15 | 143 | 125 | 18 |
| ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | 08 | 07 | 14 | 12 | 133 | 97 | 43 | 41 | 198 | 157 | 41 |
| ජාතික සමාජ සංවර්ධන ආයතනය | 53 | 34 | 09 | 03 | 49 | 40 | 26 | 22 | 137 | 99 | 38 |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය | 05 | 02 | - | - | 391 | 388 | 05 | 03 | 401 | 393 | 08 |
| සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය | 14 | 08 | 04 | 0 | 74 | 34 | 10 | - | 102 | 42 | 60 |
| ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය | 05 | 03 | 13 | 11 | 17 | 23 | 11 | 10 | 46 | 46 | - |
| උපදේශන අංශය | 1 | 1 | - | - | 334 | 329 | 1 | 1 | 336 | 331 | 5 |
| **එකතුව** | **294** | **211** | **2738** | **2080** | **29784** | **25974** | **943** | **749** | **33759** | **29013** | **4890** |

## 04 - අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය

මෙම අමාත්‍යාංශය සඳහා වැය ශීර්ෂය 171 යටතේ ද, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා වැය ශීර්ෂ 331 යටතේ ද සමාජ සේවා දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 216 යටතේද පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා වැය ශීර්ෂ 217 යටතේද ප්‍රතිපාදන වෙන් වී ඇත.

ඒ අනුව, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය සඳහා අනුමත වූ මුළු ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

| වියදම් වර්ගය | 2023 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන (රු.මිලියන) | 2023.01.01 සිට 2023.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) |
|---|---|---|
| **කාන්තා, ළමා කටයුතු හා සමාජසවිබලගැන්වීම් අමාත්‍යාංශය - වැය ශීර්ෂ 171** | | |
| ප්‍රාග්ධන | 3,041.32 | 910.44 |
| පුනරාවර්තන | 42,917.12 | 25,024.04 |
| **උප එකතුව** | **45,958.45** | **25,934.48** |
| **සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - වැය ශීර්ෂ 331** | | |
| ප්‍රාග්ධන | 166.00 | 13.29 |
| පුනරාවර්තන | 126,543.00 | 106,721.31 |
| **උප එකතුව** | **126,709.00** | **106,734.60** |
| **සමාජ සේවා දෙපාර්තමේන්තුව - වැය ශීර්ෂ 216** | | |
| ප්‍රාග්ධන | 36.00 | 8.15 |
| පුනරාවර්තන | 888.00 | 608.90 |
| **උප එකතුව** | **924.00** | **617.05** |
| **පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - වැය ශීර්ෂ 217** | | |
| ප්‍රාග්ධන | 65.00 | 37.15 |
| පුනරාවර්තන | 384.00 | 281.50 |
| **උප එකතුව** | **449.00** | **318.65** |
| **මුළු එකතුව** | **174,040.45** | **133,604.78** |

# 05 - කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය සඳහා නෛතික විධි විධාන ශක්තිමත් කිරීම පිළිබඳ සාරාංශය

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන ප්‍රතිලාභීන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කරගැනීම සඳහා අමාත්‍යාංශය විසින් අණ පනත්, ප්‍රතිපත්ති සහ විවිධ සැලසුම් සකස් කිරීමේ කටයුතු ආරම්භකර ඇත.

- **ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය සමානාත්මතා පනත හඳුන්වා දීමට කටයුතු කිරීම.**
  නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව අදාල අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ගරු නීතිපතිතුමාගේ නිරීක්ෂණයන් ද ඇතුලත් කරමින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් ඉදිරි කටයුතු කරමින් පවතී.

- **කාන්තාවන් සවිබලගැන්වීමේ පනත හඳුන්වා දීම.**
  කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීමේ පනත් කෙටුම්පත හා කාන්තාවන් සවිබලගැන්වීමේ පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මගින් කෙටුම්පත් කළ අතර, ඒවා ගරු නීතිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලදුව නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
  ජාතික කාන්තා කොමිසම පිහිටුවීමේ පනත් කෙටුම්පත හා කාන්තාවන් සවිබලගැන්විමේ පනත් කෙටුම්පත ඒකාබද්ධ කිරිම සුදුසු බවට ගරු නීතිපතිතුමා විසින් ලබාදුන් නිරීක්ෂණ අවධානයට ගෙන ජාතික කාන්තා කොමිසම පිහිටුවීමේ පනත් කෙටුම්පත හා කාන්තාවන් සවිබලගැන්විමේ පනත් කෙටුම්පත ඒකාබද්ධ කර එක් පනත් කෙටුම්පතක් සකස්කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් ඉහත පනත් දෙක ඒකාබද්ධ කර එක් පනත් කෙටුම්පතක් ලෙස සකස් කරමින් පවතී.

- **ළමා අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත**
  ශ්‍රී ලංකාවේ ළමුන්ගේ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ළමා අයිතිවාසිකම් සුරැකීමට අදාළ සියලු නීති රීති හා අණපනත් අධ්‍යයනය කර වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි එක් පනතක් වශයෙන් ළමා අයිතිවාසිකම් නීතිගත කිරීම මෙහි අරමුණයි. මේ වන විට ඒ පිළිබඳ අධ්‍යයනය කර සංකල්ප පත්‍රිකාව සකස් කර ඇත.

- **ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත**

  1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත වෙනුවට නව පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා 2023.03.13 දින කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී. එම අනුමැතියට අනුකූලව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද කෙටුම්පත අධිකරණ අමාත්‍යාංශය හරහා මෙම අමාත්‍යාංශය වෙත එවන ලද අතර ඒ සඳහා වන නිරීක්ෂණ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත යවා ඇත.

- **සංඥා භාෂා පනත් කෙටුම්පත**

  සංඥා භාෂා පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කර එවා ඇති අතර ඒ සඳහා වන එකඟතාවය නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

- **ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය**

රජයේ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය 2006 අංක 1 දරන ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි නැවත සකස් කිරීමට කටයුතු කරමින් පවතී. අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන් හා පිරිවිතරයන් සැලකිල්ලට ගෙන ප්‍රවේශ නියෝග කෙටුම්පත් කර ඇති අතර අදාළ පාර්ශවයන්ගෙන් නිරීක්ෂණ ලබා ගැනීමට නියමිතය.

# 06 - අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ආයතන ක්‍රියාත්මක වී ඇති ආකාරය

## 6.1 සංවර්ධන අංශය (කාන්තා හා ළමා කටයුතු)

### ප්‍රධාන කාර්යභාරය

ප්‍රතිපත්ති සම්පාදනය හා ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම දරන මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ අමාත්‍යාංශයේ අනෙකුත් ආයතන මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධීකරණය, එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන හා විදේශීය මෙන්ම දේශීය ප්‍රදායක ආයතන සම්බන්ධීකරණය, ජාතික මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය හා ඇගයීම් සිදුකිරීම වේ.

### ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

**1. කාන්තාවන්ට අදාළ ප්‍රතිපත්ති හා පනත් සැකසීම**

- **ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන දෙවන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**

ප්‍රධාන ආංශික සැලසුම් 13 කින් සමන්විත ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන දෙවැනි පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම, ඊට අදාළ අමාත්‍යාංශ සහ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර, අවස්ථා කිහිපයක දී සිදුකළ වැඩමුළු හරහා කෙටුම්පත සකස් කර අවසන් කර ඇත. ඊට ඇතුළත්වන ප්‍රධාන අංශ වන්නේ ළමා අංශය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා බලගැන්වීම, සමාජ ආරක්ෂණය හා සුභසාධනය, අධ්‍යාපන අංශය (උප අංශ: උසස් අධ්‍යාපනය, සාමාන්‍ය අධ්‍යාපනය, නිපුණතා සහ වෘත්තීය අධ්‍යාපනය), විදේශ රැකියා හා කම්කරු, සෞඛ්‍ය (උප අංශ: දේශීය වෛද්‍ය සහ සෞඛ්‍ය), අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ, මාධ්‍ය, යෞවනයන් පිළිබඳ අංශය (උප අංශ: යෞවන සහ ක්‍රීඩා), ප්‍රවාහන, ආපදා, ආර්ථික සවිබලගැන්වීම වේ. මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

- **ස්ත්‍රී-පුරුෂ සමාජභවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, 2023 මාර්තු 08 දින ජාත්‍යන්තර කාන්තා දිනයේ දී එළිදක්වන ලදී. මෙම ප්‍රතිපත්තිය මත පදනම්ව දැනට උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත් කරමින් පවතී.

- **කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා (UNSCR)1325 ක්‍රියාත්මක කිරීම සඳහා කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2023-2027) සකස්කර ඇත. එමඟින් ශ්‍රී ලංකාවේ ගැටුම්වලින් පීඩාවට පත් වූ සහ පශ්චාත් ගැටුම් පසුබිම්වල සිටින කාන්තාවන්ගේ සාමය සහ ආරක්ෂාවත්, කාන්තාවන්ගේ ජීවිත උසස් තලයකට නංවාලීමත්, ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීමත් කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙම සැලැස්ම 2023 මාර්තු මස 08 වැනි දිනට යෙදුණු ජාත්‍යන්තර කාන්තා දිනයේ දී එළිදක්වන ලදි.

**2. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම**

දරුවන්ට හා කාන්තාවන්ට සේවා සපයන සියලුම පාර්ශවකරුවන් ඒකාබද්ධ කොට, ගැටලු සාකච්ඡා කිරීමට කමිටු රැස්වීම් කාර්තුමය වශයෙන් පැවැත්වීම සඳහා දිස්ත්‍රික්ක 25 සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ. එම කමිටු වාර්තා කැඳවමින් ඒවායේ ජාතික මට්ටමින් සිදුකළ යුතු මැදිහත්වීම් තිබේ නම් ඊට අවශ්‍ය පියවර ගැනීම හා පසුවිපරම් කටයුතු ද සිදු කෙරේ. මේ වන විට කාර්තු රැස්වීම් 43ක් පවත්වා ඇත. දරන ලද වියදම රු. මිලියන 0.413කි.

**3. වෙනත් අමාත්‍යාංශ වෙත වාර්තා /තොරතුරු ලබාදීම හා ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු**

විදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් සිදුකරනු ලබන ඉල්ලීම් අනුව ජාත්‍යන්තර වාර්තා සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම. නිදසුන් ලෙස, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් පිටුදැකීමේ සම්මුතිය (CEDAW) කාලීන වාර්තාකරණය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR), විශ්ව කාලාන්තර සමාලෝචනය (UPR) ආදියට රේඛීය අමාත්‍යාංශය ලෙස තොරතුරු සැපයීම.

**4. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන - එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලෙහි (UNFPA) ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන්**

ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය හිංසනය වැලැක්වීමට හා වින්දිතයන් වෙත සේවා සැපයීම සඳහා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මඟින් 2023 වසර සඳහා සඳහා රු. මි. 5.363 ක් මෙම අමාත්‍යාංශයට ලැබී ඇත. එම ප්‍රතිපාදන යටතේ සංවර්ධන අංශය වෙත වෙන් කළ රු. මි. 2.55 භාවිත කර පහත වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

- ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් කාන්තාවන්ගේ සහ ඔවුන්ගේ දරුවන්ගේ හදිසි අවශ්‍යතා සපුරාලීමට රු.5000 බැගින් රු. මිලියන 1.780ක ප්‍රතිපාදන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332කට සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 24කට හදිසි අවස්ථා කළමනාකරණ පිරිවැය ලෙස ලබා දී ඇත.
- ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය හිංසනය වැලැක්වීමට (SGBV) හා ඊට සම්බන්ධ වාර්තා වූ සහ වාර්තා නොවූ සිදුවීම් ලබා ගැනීමට සුපරීක්ෂාකාරී කණ්ඩායමක් පුහුණු කිරීම සහ දිස්ත්‍රික්කය තුළ සේවා සපයන්නන් සමඟ වඩා හොඳ සම්බන්ධීකරණයක් සඳහා යාන්ත්‍රණයක් සැකසීමේ අරමුණින් නියමු වැඩසටහනක් කෑගල්ල දිස්ත්‍රික්කයේදී පැවැත්විණි. මහනුවර දිස්ත්‍රික් වැඩසටහන ඔක්තෝබර් මස පැවැත්වීමට නියමිතය.

**5. ආසියානු සංවර්ධන අරමුදල - ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය (ADB ) යටතේ නීති ආධාර සහ ස්ත්‍රී - පුරුෂභාවය පිළිබඳ දැනුවත් කිරීම හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ වැඩසටහන.**

ග්‍රාමීය මට්ටමින් බහුලව වාර්තා වන ගෘහස්ත හිංසන ඇතුළු සියලු ආකාරයේ හිංසන, අපයෝජන හා අපචාර වළක්වා ගැනීමට හා ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහන් **පැවැත්වීම සිදු කෙරේ.** 1938 කාන්තා උපකාරක දුරකතන සේවාවට වැඩියෙන් පැමිණිළි ලැබෙන දිස්ත්‍රික්ක තෝරාගෙන එම දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක හඳුනාගත් ප්‍රතිලාභීන් 1500ක් සඳහා පැවැත්වීමට කටයුතු කරමින් පවතින අතර මහර, ඇඹිලිපිටිය, හම්බන්තොට හා පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ක්‍රියාත්මක කර අවසන් කර ඇත.

**6. මිනිස් ජාවාරම පිටුදැකීම හා මෙහෙයවීම පිළිබඳ ජාතික උපාය මාර්ගික සැලැස්මේ අමාත්‍යාංශයට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම**

මේ වන විට පවතින ආර්ථික අර්බුදය හමුවේ මිනිස් වෙළඳාමට ගොදුරුවීමේ වැඩි අවදානමට පත්ව ඇත්තේ කාන්තාවන් හා ළමුන් වේ. ඔවුන් මිනිස් වෙළඳාමට භාජනය වීම වළක්වා සුරක්ෂිත කිරීම අරමුණු කරගෙන "කුට්ටනය (Human Trafficking)" සම්බන්ධ නෛතික කරුණු පිළිබඳ දිවයින පුරා විහිදී සිටින ක්ෂේත්‍ර නිලධාරීන්, මෙන්ම 1929 හා 1938 දුරකථන සේවාවන්හි නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීම අඛණ්ඩව සිදුවේ.

**7. දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

- **මාධ්‍ය ප්‍රචාරණය**

කාන්තාවන් සහ දරුවන් උදෙසා ජාත්‍යන්තර වශයෙන් වෙන්ව ඇති දිනයන්හිදී ඒ පිළිබඳව සමාජය දැනුවත් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රවෘත්ති, සම්මුඛ සාකච්ඡා හා පුවත්පත් අතිරේක ආදිය හරහා ප්‍රචාරණ කටයුතු සිදුකර ඇත. කාන්තාවන් සවිබලගැන්වීම සහ ඔවුන් සුරැකීම උදෙසා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති, ක්‍රියාකාරකම් පිළිබඳවත්, කාන්තාවන්ට හා දරුවන්ට හිතකර අයුරින් සදාචාරාත්මක ලෙස මාධ්‍ය හැසිරවීම උදෙසා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන විවිධ වැඩසටහන් පිළිබඳවත් සමාජය සංවේදී කිරීම සඳහා මාධ්‍යන්හි දායකත්වය ලබා ගැනීම සිදු කෙරේ.

# 6.2 සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය (කාන්තා හා ළමා කටයුතු)

## ප්‍රධාන කාර්යභාරය

ළමා හා කාන්තා ක්ෂේත්‍රය තුළ අමාත්‍යාංශ සේවාවන් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සැලසුම්කරණය, මෙහෙයුම්කරණය, පසුවිපරම්කරණය සිදුකිරීම හා අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාවන් ක්‍රමවත්ව පවත්වාගෙන යාම, ශක්තිමත්ව රාජ්‍ය ප්‍රතිපත්තිය හා අදාළ සියලුම තාක්ෂණික ප්‍රතිපත්තීන්ට අනුකූලව අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කටයුතු පවත්වාගෙන යාම.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30ට මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 1. සැලසුම්කරණය

අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රධාන කාර්යසාධන සැලැස්ම, තිරසර සංවර්ධන අභිමතාර්ථ සැලැස්ම ඇතුලු කාන්තා හා ළමා ක්ෂේත්‍රයට අදාළ සැලසුම් සකස් කිරීම සිදු කර ඇත. ඊට අමතරව, ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති හා නිර්දේශ අනුව මෙම අමාත්‍යාංශ විෂය පථය යටතේ විවිධ ආයතන/ දෙපාර්තමේන්තු හා වෙනත් අමාත්‍යාංශ මඟින් සකස් කෙරෙන සැලසුම් හා ප්‍රතිපත්ති වෙනත් කාලීන වාර්තා සඳහා තාක්ෂණික සම්පත්දායකත්වය ලබාදීම සිදු කර ඇත.

### 2. මෙහෙයුම්කරණය

අමාත්‍යාංශයේ සියලු සංවර්ධන වැඩසටහන්වලට අදාළ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තාකරණය හා ප්‍රගති සමාලෝචන සාකච්ඡා පැවැත්වීම. ඒ යටතේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 08 ක් පවත්වා ඇත.

### 3. පසුවිපරම්කරණය

ගාල්ල, මහනුවර හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ව්‍යවසායකත්ව/ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති නිරීක්ෂණය කර එම ව්‍යාපෘතීන්හි සාර්ථකත්වය හා තිරසරභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නිර්දේශ ඇතුළත් වාර්තා අදාළ ක්‍රියාත්මක ආයතන වෙත ලබා දීම සිදුකර ඇත. නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ තවත් ක්ෂේත්‍ර නිරීක්ෂණයක් සැලසුම් කර ඇත.

### 4. "ලංකා විමෙන් - ඊ මාකට්" ව්‍යවසායකත්ව තොරතුරු හුවමාරුව හා ඊ ඩිරෙක්ටරිය

ව්‍යවසායක කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ ඔවුන් ආර්ථිකව සවිබලගැන්වීම අරමුණු කර ගනිමින් නිර්මාණය කරන ලද ඉහත අලෙවිකරණ වේදිකාව හරහා ව්‍යවසායක කාන්තාවන්ගේ වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීමටත් ඔවුන්ගේ නිෂ්පාදන හා සේවාවන් දේශීය මෙන්ම අන්තර්ජාතික වෙළඳපොළෙහි ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමටත් අවස්ථාව සලසා ඇත. මෙම පද්ධතියට (https://lankawomenemarket.gov.lk) යන දිගුව ඔස්සේ පිවිසිය හැකිය. දැනට කාන්තාවන් 316ක් පද්ධතියේ ලියාපදිංචි කර ඇත. පද්ධතියට කාන්තාවන් ඇතුළත් කිරීම පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු සැසි 03ක් පවත්වා ඇත. මේ පිළිබඳ වනිතා සංවර්ධන නිලධාරීන් 216 පුහුණු කර ඇත.

මීට අමතරව "ලංකා විමෙන් ඊ මාර්කට්" අලෙවිකරණ වේදිකාවේ ලියාපදිංචි වී සිටින ව්‍යවසායක කාන්තාවන් 52 ක ගේ තොරතුරු ඇතුළත් කර ලංකා විමෙන් ඊ ඩිරෙක්ටරිය සකසා ඇත. එහි ව්‍යවසායක කාන්තාවන්ගේ විස්තර හා ඔවුන්ගේ නිෂ්පාදන ඇතුළත් කර ඇත. එයට අමාත්‍යාංශ යූ ටියුබ් චැනලය (https://youtu.be/gaWNBVryOsk) හා අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය ඔස්සේ ප්‍රවේශ විය හැකිය.

**5. ‘‘සුහුරුකත’’ සඟරාව**

කාන්තාවන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කර ඔවුන් තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙන් සවිබලගැන්වීම අරමුණු කර ගනිමින් "සුහුරුකත" නම් වූ සඟරා කලාපයක් සිංහල මාධ්‍යයෙන් එළි දක්වනු ලබයි. 2023 වර්ෂය සඳහා සුහුරුකත සඟරාවේ ඊ් කලාපයක් එළිදැක්වීමට මේ වන විට කටයුතු කරමින් පවතී.

**6. නිල වෙබ් අඩවිය, යූ ටියුබ් චැනලය හා ෆේස්බුක් පිටුව යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම.**

අමාත්‍යාංශයේ කාලීන තොරතුරු නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීම සඳහා අඛණ්ඩව යාවත්කාලීන කර පවත්වාගෙන යාම සිදු කෙරේ. වෙබ් අඩවිය නව මුහුණුවරකින් නවීකරණය කර පවත්වාගෙන යාමට අදාළ කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත.

**7. දරුවන්ගේ පෝෂණය ඉහළ නැංවීම. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) වැඩසටහන සම්බන්ධීකරණය**

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මඟින් මුලතිව්, කෑගල්ල, කිළිනොච්චි, පුත්තලම, අනුරාධපුර, මොණරාගල, වව්නියා, නුවරඑළිය හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි මාස 05ත් අවුරුදු 02ත් අතර දරුවන්ගේ පෝෂණය ඉහල නැංවීම සඳහා දියත් කර ඇති වැඩසටන අමාත්‍යාංශය වෙනුවෙන් සම්බන්ධීකරණය සිදු කෙරේ.

එහිදී මාස 04ක් දක්වා රු. 6,750/-ක මාසික දීමනාවක් එම දරුවන්ගේ මව්වරුන්/ රැකබලාගන්නන් 110,687ක් සඳහා UNICEF ආයතනය මඟින් සෘජුවම අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන නිකුත් කර ඇත.

**8. දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

- **කෘතිම බුද්ධිය පිළිබඳව පුහුණු වැඩසටහන්**

ළමා හිංසනයන් වළක්වා ගැනීම උදෙසා ක්‍රියාත්මකවන ජාතික වැඩසටහන් මාලාවට සමගාමීව කාන්තා හා ළමා ආරක්ෂාව වෙනුවෙන් කෘතිම බුද්ධිය භාවිතය පිළිබඳ සියලුම දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සූම් මාධ්‍යයෙන් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ සම්පත්දායකත්වයෙන් පැවැත්වූ අතර, නිලධාරීන් 188 ක්‍රියාකාරීව ඊට සහභාගී විය. දෙවන වැඩසටහන ඔක්තෝබර් මස පැවැත්වීමට සැලසුම් කර ඇත.

- **සාමාන්‍ය තොරතුරු තාක්ෂණ පුහුණුව**

තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම හා පරිගණක සාක්ෂරතාව ඉහල නැංවීම සඳහා පුහුණු වැඩසටහන් 16 ක් අමාත්‍යාංශ නිලධාරීන් සඳහා භෞතිකව හා මාර්ගගතව පවත්වා ඇත. මේ වන විට අමාත්‍යාංශ නිලධාරීන් 183 ක් මෙම පුහුණු වැඩසටහන් ඔස්සේ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා ඇත.

- **‘‘සුහුරුලිය ’’ වැඩසටහන**

“සුහුරුලිය” ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ඒකාබද්ධව 2017 වසරේ ආරම්භ කර මේ දක්වා ක්‍රියාත්මක වන කාන්තා ප්‍රජාව තොරතුරු තාක්ෂණයෙන් සවිබලගන්වන කාලීන වැඩසටහන් මාලාවක එක් අංගයකි. මෙම වැඩසටහන මඟින් විශේෂයෙන්ම ව්‍යවසායකයන් ලෙස ඉදිරියට එන කාන්තාවන්හට තොරතුරු තාක්ෂණ දැනුම, අන්තර්ජාල භාවිතය හා ඩිජිටල් අලෙවිකරණ භාවිතය පිළිබඳව ලබා දෙන දැනුම රටේ සංවර්ධන කටයුතු සඳහාද බොහෝ සෙයින් ඉවහල් වේ. “සුහුරුලිය” පළමු අදියර සාර්ථක නිමාවෙන් පසු දෙවන අදියරට අදාළ උපායමාර්ග සැලැස්ම සකස් කිරීම අප අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදු කරන ලදී.

# 6.3 මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

## හැඳින්වීම

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, රාජ්‍ය , රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශය ඒකාබද්ධව මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම, දත්ත රැස් කිරීම හා පවත්වාගෙන යාම, මුල් ළමාවිය සංවර්ධනයට අදාල පුහුණු හා ධාරිතා සංවර්ධනය ඉටු කරනු ලබන ජාතික යාන්ත්‍රණයයි.

## ප්‍රධාන කාර්යභාරය

- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කිරීම.
- රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරීම.
- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට අදාළ වන පර්යේෂණ සිදු කිරීම, දත්ත රැස්කිරීම සහ වැඩසටහන් සම්පාදනය කිරීම.
- මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනයට අදාළ මානව සම්පත් සංවර්ධනය

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30ට මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 1. ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට රුපියල් 45,000/- ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන

පවුලේ මාසික ආදායම රු.50,000.00 සීමාව නොඉක්මවන මව්වරුන් සඳහා රු.45,000/- ක් වටිනා වවුචර් නිකුත් කෙරේ. ඒ අනුව, එම වවුචර් මඟින් ගර්භණී සමයේ අවසන් මාස 06 හා කිරි දෙන සමයේ පළමු මාස 04 සඳහා අවශ්‍ය පෝෂණීය ආහාර ද්‍රව්‍ය ලබාගැනීමට හැකියාව ඇත. මේ වනවිට ගර්භණී මවුවරුන් 188,174 ක් සඳහා රු.මිලියන 2360.364 ක් වියදම් දරා ඇත.

### 2. පෙර පාසල් දරුවන්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාර වේලක් ලබාදීමේ වැඩසටහන

2022 අගෝස්තු 01 දින සිට 2023 මැයි 15 දක්වා ලෝක බැංකු ව්‍යාපෘතියේ මූල්‍යාධාර මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර, 2023 මැයි 15 දින සිට ලෝක බැංකු ව්‍යාපෘතිය අවසන් වීම හේතුවෙන් මෙම වැඩසටහන දැනට භාණ්ඩාගාර ප්‍රතිපාදන මත සිදු කෙරේ. ඒ අනුව පෙර පාසල්ගත දරුවන් 86,468ක් සඳහා දරන ලද මුළු වියදම රු.මිලියන 203.591ක් වේ.

### 3. පෙර පාසල් ගුරුවරියන් සඳහා මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන - "ගුරු අභිමාණී"

පෙර පාසල් ගුරුවරියන් වෙත ලබාදුන් රු.250.00ක මාසික දීමනාව 2022 වර්ෂයේ ජූනි මස සිට ක්‍රියාත්මක වන පරිදි රු.2500.00ක් දක්වා ඉහළ නංවා ඇත. 2023 වර්ෂයේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි වැඩසටහන ක්‍රියාත්මක කල අතර ප්‍රතිලාභී ගුරුවරුන් 15,726 ක් සඳහා දරන ලද වියදම රු.මිලියන 236.946කි.

### 4. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ අනෙකුත් වැඩසටහන්

- **මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව ජාතික සම්බන්ධීකරණ කමිටුව**

සැලසුම් සම්පාදනයේදී, ක්‍රියාත්මක කිරීමේදී සහ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ කාර්යන්වලදී ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා බහු ආංශික සහයෝගීතාවය සහතික කිරීම මෙහි

අරමුණ වන අතර මේ වනවිට සියලු පාර්ශවයන් නියෝජනය කරමින් ජාතික සම්බන්ධීකරණ කමිටු වාර 2ක් පවත්වා ඇත.

- **පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන නියාමනය හා අධීක්ෂණ අනු කමිටුව**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ගුරු ඩිප්ලෝමා ආයතන 63 හි පවතින ගැටලු සම්බන්ධව නැවත පරීක්ෂාකර අඩුපාඩු සකස් කිරිම සහ නව ලියාපදිංචිය ඉල්ලා සිටින ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන ලියාපදිංචිය සඳහා අවශ්‍ය නිර්ණායක සකස් කිරීම මෙම අනු කමිටුවේ ප්‍රධාන අරමුණ වන අතර කමිටු වාර 03ක් පවත්වා ඇත.

එම ආයතන පරීක්ෂා කිරීම සඳහා නිර්ණායක සකස් කර අවසන් කර ඇති අතර, ඉදිරියේදී පළාත් නිලධාරීන් සහ දිස්ත්‍රික් නිලධාරීන් වෙත තොරතුරු ලබාදීමට සැලසුම් කර ඇත.

## 5. ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

- **නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය**

තෝරාගත් පවුල් ඒකක සඳහා අවශ්‍ය මැදිහත්කරණය හා මඟ පෙන්වීම තුළින් නිවස තුළ දරුවාගේ උපරිම යහපත හා සංවර්ධනයට ඉඩ සැලසෙන ළමා හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම, දරුවාගේ සමස්ථ සංවර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම තුළින් නිවස තුළ ළමා මිතුරු පරිසරයක් ගොඩ නැඟීම සහ දෙමාපිය හා රැකබලාගන්නන්ගේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය හා සම්බන්ධ දැනුවත්භාවය ඉහල නැංවීම මෙමඟින් අපේක්ෂා කෙරේ. එමඟින්, දරුවාගේ සමස්ත සංවර්ධනය තහවුරු කිරීම, පවුල තුළ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරිම හා ළමා මන්දපෝෂණය අවම කිරීම, අවදානම් සහගත සහ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් මුල් කාලීනව හඳුනා ගැනීම හා අවශ්‍ය සේවාවන් සඳහා යොමුකිරීම අරමුණු කරගෙන ඇත. සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පවුල් ඒකක ඉලක්ක කරගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර පවුල් ඒකක 537ක් සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් හා මැදිහත්කරණය සිදුකර ඇත.

- **එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ප්‍රමිතිගත පෙර පාසල් පහක් ඇති කිරීමේ ව්‍යාපෘතිය**

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන අරමුණු කර ගනිමින් එහි ගුණාත්මක හා භෞතික සංවර්ධනය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම සඳහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජාතික ප්‍රමිති යාවත්කාලීන කර 2022 වර්ෂයේදී නැවත එළි දක්වා ඇත. ඒ අනුව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පිහිටා ඇති අවම ප්‍රමිති මට්ටමට ළඟාවී නොමැති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 5ක් බැගින් තෝරා ගනිමින් ඒවා ප්‍රමිතිගත මට්ටමට ගෙන ඒමටත්, සෞඛ්‍ය ප්‍රවර්ධිත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් බවට පත් කිරීමත් මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, පළාත් සභා පෙර පාසල් ඒකකය හා සම්බන්ධ වෙමින් මේ සඳහා කටයුතු කරනු ලබයි.

එසේම, සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදී මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 922 ක අවශ්‍ය දැනුවත් කිරීම් හා මැදිහත්කරණයන් සිදු කර ඇත.

- **මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ කාර්යයභාරයේ ඵලදායීත්වය ඇගයීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ වෙමින් මාසික හා කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලබයි. මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් වාර 09 ක් මේ වනවිට පවත්වා ඇත.

## 6. දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- **මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය**

සෑම වර්ෂයකම ජූලි මස 14 දින සිට 20 දින දක්වා මුල් ළමාවිය විෂය හා සම්බන්ධව වගකිවයුතු සියලු පාර්ශවයන් ඒකරාශි කර ගනිමින්, මුල් ළමාවිය දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් ජාතික, පලාත්, දිස්ත්‍රික්ක සහ ග්‍රාමීය මට්ටමින් පැවැත්වීම සිදු කරයි. 2023 වර්ෂයේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය පිළිබඳ ජාතික සතිය තුල **මුල් ළමාවිය පුබුදුවන්නට සැවොම එක්වෙමු සෙනෙහසින්** තේමාව ඔස්සේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබිණ. ඒ යටතේ,

- මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ සෙත්සිරිපාය අදියර 1 සහ අදියර 2 හි අංශ 25ක නිලධාරීන් 500 ක් වෙනුවෙන් දැනුවත් කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධව ප්‍රතිපත්ති සම්පාදකයන් සමඟ මුල් ළමාවිය ජාතික ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳ දෙදින වැඩමුළුවක් පැවැත්වීම.
- ගැබිණි මවුවරුන් 200ක් ඉලක්ක කර ගනිමින් කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන සහ එම වැඩසටහනට සමගාමීව බස්නාහිර පළාත තුළ (කළුතර, ගම්පහ,කොළඹ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 40ක ගැබිණි මවුවරුන් 40, 000ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් යුනිලීවර් ආයතනයේ අනුග්‍රහය මත සිදු කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය සම්බන්ධයෙන් දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 255 ක් තුළ සිදු කිරීම, යන කාර්යයන් ඉටු කර ඇත.

## 6.4 මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධනයේ පවත්නා සුවිශේෂී අවශ්‍යතාවයන් හා ගැටලු සැලකිල්ලට ගනිමින් ප්‍රථම වරට මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය ලෝක බැංකු ණය ආධාර මත 2016 දී ආරම්භ කෙරිණි. 2023 ජුනි දක්වා ක්‍රියාත්මක වූ මෙම සමස්ත ව්‍යාපෘතියේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා සැමට එක සේ ලබාගත හැකි සේවාවක් බවට පත් කිරීමයි.

### ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

- අඩු ප්‍රතිලාභ සහිත/ප්‍රතිලාභ නොලද ප්‍රදේශවල නව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම හා පෙර පාසල් නවීකරණය කිරීම.
- හඳුනාගත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් උපකරණ කට්ටල ලබාදීම.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා කියවීමේ ද්‍රව්‍ය කට්ටල ලබාදීම.
- හඳුනාගත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වෙත ජල පෙරණ උපකරණ (Water filters), ක්‍රීඩා උපකරණ, ලී බඩු උපකරණ ලබාදීම.
- හඳුනාගත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම.
- පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජනමාධ්‍ය හරහා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීම (2023 ජනවාරි-ජූනි දක්වා).
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා මධ්‍යස්ථාන ඉදිකිරීම්.

2023 වර්ෂයේ ඉටු කරනු ලැබූ ඉහත ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වෙනුවෙන් රු.මි. 886.650ක් වැය වී ඇත.

# 6.5 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් අනාථ, අත්හල, අසරණ හා ගැටුම්වලින් අවතැන් වූ යන සියලු කණ්ඩායම්වල ළමුන්ට සම අවස්ථාවන් ඇති කරලීම සඳහා ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති හා නෛතික විධිවිධාන අනුව කටයුතු කරනු ලබන ජාතික මට්ටමේ ආයතනයයි.

## ප්‍රධාන කාර්යභාරය

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද නීතිමය ගැටලුවලට යොමු වූ ළමයින් ද සුවිශේෂී කර ගනිමින් සියලු ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ගනිමින් ඔවුනට සමාන අවස්ථාවන් උදාකරදීම යන මෙහෙවර යටතේ පරිවාස සේවය හා ළමාරක්ෂණ සේවය ක්‍රියාත්මක වේ.

පරිවාස සේවය යටතේ ප්‍රධාන වශයෙන් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කාර්යයන් සඳහා සම්බන්ධීකරණය හා සහායවීම, පරිවාස සේවය සඳහා ඒ යටතේ ක්‍රියාත්මක වන විවිධ ආයතන සඳහා අවශ්‍ය අවස්ථාවලදී මඟපෙන්වීම, ජාතික ප්‍රතිපත්ති/ ප්‍රමිතීන් සකස් කිරීම, විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම, ළමුන්ට අදාළ නීති සංශෝධනය හා නව නීති සම්පාදන කටයුතු සඳහා සහාය වීම ආදී කටයුතු සිදු කරනු ලැබේ.

ළමාරක්ෂණ සේවය යටතේ ළමා ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම, ළමාරක්ෂණය සඳහා වන සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම, ළමාරක්ෂණය සඳහා දිවයින පුරා ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම ආදී කටයුතු දිවයින පුරා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/ සහකාර හරහා සිදු කරනු ලැබේ.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 1. ළමා අයිතිවාසිකම් පිළිබඳ මෙහෙයුම් කමිටු වැඩසටහන

ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් පිහිටුවා ඇති කමිටු ධූරාවලිය ළමුන් විෂයෙහි හඳුනා ගන්නා ගැටලු සාකච්ඡාවට ගැනීම තුළින් විසඳුම් ලබාදීමේ ක්‍රියාවට මුලපුරන ප්‍රධාන යාන්ත්‍රණයයි.

මෙම වසර තුළදී පිහිටුවන ලද නව කමිටුද ඇතුලුව දිවයින පුරා ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු 10,070 ක් මේ වන විට පිහිටුවා ඇත. තවද මෙම වසරේදී ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු 390 ක් ශක්තිමත් කිරීම හා ප්‍රතිසංවිධාන කටයුතු සිදු කර ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු රැස්වීම් මේ වන විට 743 ක් පවත්වා ඇති අතර මූල්‍ය ප්‍රගතිය රු.මි.1.916 කි. ළමා අයිතිවාසිකම් පිළිබඳ පළාත් මෙහෙයුම් කමිටු රැස්වීම් 14 ක් පවත්වා ඇති අතර වියදම රු.මි.0.1245 කි. තවද ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 2 ක් පවත්වා ඇති අතර රු.මි.0.033 ක් වියදම් වී ඇත. මෙම වසරේ නොවැම්බර් මස තුලදි තවත් රැස්වීමක් පැවැත්වීමට නියමිතය.

- **එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පිළිබඳ 7 වන රාජ්‍ය කාලාන්තර වාර්තාව.**

එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මෙරට ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය ඇතුලත්ව, වසර 5ට වරක් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව වෙත ඉදිරිපත් කලයුතු රාජ්‍ය වාර්තාව මෙම වසර තුලදී දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී. මේ සඳහා ළමයින් සම්බන්ධයෙන් කටයුතු කරන

රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශව ආයතන 65 ක් සහ ළමයින් 1144 ක සහභාගීත්වයෙන් ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් පැවති උපදේශන වැඩමුළු 20 ක් හරහා තොරතුරු ලබා ගන්නා ලදී.

## 2. ළමා සමාජ හා ළමා සභා වැඩසටහන

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ශ්‍රී ලාංකීය ළමුන්ගේ සහභාගීත්ව අයිතිය වඩාත් අර්ථාන්විතව සහතික කිරීම සඳහා ක්‍රියාත්මක වන වැඩසටහනකි. ග්‍රාමසේවා වසම් මට්ටමින් පිහිටුවනු ලබන ළමා සමාජ ධූරාවලිය ජාතික ළමා සභාව දක්වා විහිදේ. මේ යටතේ ළමා සමාජ 9444ක් පිහිටුවා ලියාපදිංචි කර ඇති අතර එහි සාමාජික සංඛ්‍යාව 400,000 කට ආසන්න වේ.

මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය ළමා සභා රැස්වීම් 390 ක් පවත්වා ඇති අතර දිස්ත්‍රික් ළමා සභා රැස්වීම් 45ක් පවත්වා ඇත. මේ සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 2.459 කි. තව ද ජාතික ළමා සභා රැස්වීම් 02 ක් ද පවත්වා ඇති අතර, ඒසඳහා සහභාගී වූ මුළු ළමුන් සංඛ්‍යාව 350කි.

## 3. අවදානම් දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම

දරුවන් විවිධ වූ අපයෝජනයන්ට ගොදුරුවීම වැළැක්වීමේ අරමුණින් විවිධ වූ තාක්ෂණික ක්‍රම අනුගමනය කරමින් අවදානම් තත්ත්වයන් හඳුනාගෙන, බහුවිධ ප්‍රවේශයන් ඔස්සේ ආරක්ෂණ සැලසුම් සකස් කිරීම හා එතුළින් දරුවන් තම පවුල් ඒකකය තුළම තබාගෙන ආරක්ෂාව තහවුරු කිරීම, සංවර්ධනය කිරීම මෙහි අරමුණ වේ. මේ වන විට දෙපාර්තමේන්තුව වෙත ආරක්ෂණ සැලසුම් 657 ක් යොමු වි ඇති අතර දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ සැලසුම් 105 ක් ක්‍රියාත්මක වේ. ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය සඳහා සැලසුම් 44 ක් යොමු කර ඇති අතර ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/සහකාර විසින් ප්‍රතිපාදන රහිතව විසඳුම් ලබා දි ඇති සැලසුම් සංඛ්‍යාව 150 කි. මේ වන විට දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ක්‍රියාවට නංවන සැලසුම් 37 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.1.414 ක් වැය දරා ඇත.

## 4. ළමා මූලික අධ්‍යයන

දරුවන් අවදානම් තත්ත්වයට පත්කරන සිදුවීම්, අවස්ථා, ස්ථාන, දරුවන් විසින්ම හඳුනාගෙන, ඒ සඳහා වන ව්‍යාපෘති යෝජනා ඔවුන් විසින්ම සකස් කර ක්‍රියාවට නැංවීම මේ යටතේ සිදු කෙරේ. මේ යටතේ හඳුනාගෙන ඇති වැඩසටහන් 05 ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රතිපාදන යොමු කර ඇති අතර වැඩසටහන 3ක මූල්‍ය ප්‍රගතිය ලෙස රු.මි.0.075 ක් වාර්තා වී ඇත.

## 5. ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවමකරණ වැඩසටහන (CCDRR)

ස්වභාවික ආපදා තත්ත්වයන්වලදී පෙර සූදානම් ක්‍රියාවලිය තුල දරුවන් සාධනීය මැදිහත්කරුවන් ලෙස ශක්තිමත් කිරීම අරමුණින් ක්‍රියාත්මක වැඩසටහනකි. මෙම වැඩසටහන ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක කෙරේ. මෙහිදී දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් වූ ව්‍යාපෘති 22ක් ක්‍රියාත්මක කර ඇති අතර හොඳම ව්‍යාපෘති 3ක් ඇගයීමට ලක් කරන ලදී. මෙම වැඩසටහන යුනිසෙෆ් ආධාර මත ක්‍රියාත්මක වැඩසටහනකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 143ක ව්‍යාපෘති ක්‍රියාත්මක වී ඇති අතර වාර්තා වී ඇති ප්‍රගතිය රු.මි. 1.430 කි.

## 6. අධ්‍යාපන අයිතිය තහවුරු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වැඩසටහන්

- **කැපකරු දෙගුරු ආධාර වැඩසටහන**

රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක වැඩසටහනකි. මේ යටතේ වසරකට එක් දරුවකු සඳහා රු. 12,000ක මුදලක් ලබා දේ. මේ වන විට ළමුන් 1847 ක් සඳහා රු. මිලියන 10.466 ක් ප්‍රගතියක් වාර්තා වි ඇත. මේ යටතේ ළමුන් 1990 ප්‍රතිලාභ ලබයි.

- **කඩින්කඩ පාසල් යන ළමුන් හා පාසල් අතහැර යාමේ අවදානමක් ඇති ළමුන් සඳහා වන ආධාර වැඩසටහන**

මේ යටතේ දරුවන් 215ක් සඳහා පාසල් උපකරණ ලබා දීම සිදුකර ඇත. මේ වන විට වාර්තා වී ඇති වියදම රු. මිලියන 0.430කි.

## 7. අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සඳහා බාහිර ආයතන අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

- **සිප් සවිය**

මෙය ඇට්ලස් ආයතනයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වැඩසටහනකි. එක් ළමයෙකුට මාසිකව රු. 2000 බැගින් අනුග්‍රාහකත්වය ලබා දේ. මේ වන විට ළමුන් 230ක් සඳහා ප්‍රතිපාදන ලබාදේ. ලබා දී ඇති මුළු මුදල රු.මි.4.24 කි.

- **"සෙවණ සරණ" කැපකරු මාපිය ක්‍රමය**

කැපකරු මාපියන්ගේ මූල්‍යාධාර මත ආර්ථික අපහසුතා සහිතව අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම සඳහා ක්‍රියාත්මක වැඩසටහනකි. මේ යටතේ ළමුන් 10 ක් සඳහා රු.මි. 0.216 ක් යොමු කර ඇත.

- **අත්වැල වැඩසටහන**

දරුවෙකුට සුරක්ෂිත පවුලක ජීවත්වීමට ඇති ආරක්ෂාව, සෞඛ්‍ය, පෝෂණය හා අධ්‍යාපනය යන අයිතීන් තහවුරු කරමින් දරුවන්ගේ සමස්ත වර්ධනය සැලසීමේ අරමුණින් ක්‍රියාත්මක වැඩසටහනකි. අනුග්‍රාහකයින් හා ආධාර අපේක්ෂිත දරුවන්/පවුල් අතර සම්බන්ධීකරණයක් දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ. මේ යටතේ ළමුන් 485 දෙනෙකු ප්‍රතිලාභ ලබමින් සිටී.

## 8. ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව සෞඛ්‍ය හා පෝෂණයට ඇති අයිතිය තහවුරු කිරීම

මේ යටතේ ක්‍රියාත්මක වැඩසටහන් ලෙස අඩු ආදායම්ලාභී දරුවන් සඳහා හදිසිවිපත්, නිවුන් දරු, වෛද්‍ය හා පෝෂණ ආධාර ලබා දීමේ වැඩසටහන් පෙන්වා දිය හැක. මේ යටතේ ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව පහත පරිදි වේ.

- වෛද්‍ය හා පෝෂණ ආධාර - ළමුන් 25
- නිවුන් දරු ආධාර - ළමුන් 180
- හදිසිවිපත් ආධාර - ළමුන් 19

## 9. රාජ්‍ය නොවන සංවිධාන මඟින් ක්‍රියාත්මක වැඩසටහන්

- **ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකු ආධාර මත ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ ළමා නිවාසවල මූලික අවශ්‍යතා සපුරාලීම, ළමා නිවාසවල කාර්ය මණ්ඩල පුහුණුව, ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය මට්ටමින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/ සහකාරවරුන් පුහුණුව, අවදානම් දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම, රැකවරණ මධ්‍යස්ථානවල සිටින යෞවනයින් සඳහා ජීවනෝපාය සංවර්ධනයට සහායවීම හා එම මධ්‍යස්ථානවල පහසුකම් සංවර්ධනය යන කාර්යයන් සිදු කරමින් පවතී.

- **එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) වැඩසටහන්**

මේ යටතේ ප්‍රධාන කාර්යයන් ලෙස ළමා මූලික පර්යේෂණ හරහා හඳුනාගනු ලැබූ ළමා මූලික ආපදා අවදානම් අවම කිරීම, ආයතනගත දරුවන් පවුල සමඟ නැවත එකතු කිරීමට හෝ සමාජගත කිරීම සඳහා සහයවීම, දරුවන් ආයතනගත කිරීම වැළැක්වීම පිණිස පවුල් පාදක රැකවරණය ශක්තිමත් කිරීම සහ ඩිජිටල් කතන්දර කීමේ නැඩසටහනක් දැක්විය හැක.

## 10. දැනුවත් කිරීමේ හා පුහුණු කිරිමේ වැඩසටහන්

- **ධාරිතා වැඩසටහන්**

ළමා අයිතිවාසිකම් සමාජය තුළ තහවුරු කිරීම හා ළමා අපයෝජනයන් නිවාරණය කිරීමේ අරමුණින් සිවිල් සමාජය දැනුවත් කිරීම සඳහා විවිධ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මේ යටතේ අගය කළ යුතු දරුවකු වන්නේ කෙසේද? යන්න පිළිබඳ දරුවන්ගේ ධාරිතා වැඩසටහන් 291ක් දැනට පවත්වා ඇති අතර දරන ලද වියදම රු. මිලියන 2.193 කි. තවද ප්‍රතිපාදන රහිතව මේ වන දැනුවත් කිරීමේ වැඩසටහන් 2,085 ක් සිදු කර ඇත. දැනුවත් කිරීමෙ වැඩසටහන් සම්බන්ධයෙන් සහභාගී වූ ප්‍රතිලාභී ළමුන් සංඛ්‍යාව 103,000 ක් පමණ වේ.

- **ආන්තික ප්‍රජාවගේ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම**

ළමා අයිතිවාසිකම් කඩවීමේ වැඩි අවදානමක් ඇති වතු, විදී, මහල් නිවාස, ධීවර හා ආදිවාසී වැනි ආන්තික ජනතාවගේ දරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට ක්‍රියාත්මක වැඩසටහනකි. මේ යටතේ වැඩසටහන් 19 ක් සඳහා රු.මි. 0.750 ක් යොමු කර ඇති අතර උප්පැන්න නොමැති ළමුන් සඳහා උප්පැන්න සහතික ලබාදීමේ වැඩසටහන් 03ක් ද වතු අශ්‍රිත දරුවන් සඳහා වැඩසටහනක් ද , ආන්තික දරුවන් හා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද ලෙස මුළු වැඩසටහන් 5 ක ප්‍රගතිය රු.මි 0.126 ක් වාර්තා වී ඇත.

- **Digital Story Telling වැඩසටහන**

ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ භාවිතයෙන් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට හා අදාළ පණිවුඩ, ක්‍රියාකාරකම් සමාජගත කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා ලබාදීමේ අරමුණින් යුනිසෙෆ් ආයතනයේ මූල්‍ය හා තාක්ෂණික අනුග්‍රහය ඇතිව දෙපාර්තමේන්තු නිලධාරීන් හා ළමා සමාජ දරුවන් සඳහා ක්‍රියාත්මක වැඩසටහනකි. වැඩසටහන් 19 ක් පවත්වා ඇති අතර දරුවන් සහ නිලධාරීන් 570 ක් මේ යටතේ පුහුණු වී ඇත. පුහුණුලාභීන් ඉදිරිපත් කරන ලද නිර්මාණ 620 ක් කාණ්ඩ 12 ක් යටතේ ඇගයීමට ලක්කරන ලදී.

## 11. දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක නව වැඩසටහන්.

- **ආර්ථික අපහසුතාවලින් යුතු පවුල්වල දරුවන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම.**

මෙම වැඩසටහන ආසියානු සංවර්ධන බැංකු ආධාර මත පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වැඩසටහනකි. ආර්ථික අපහසුතාවලින් යුතු පවුල්වල දරුවන් හඳුනාගනිමින් එම දරුවන් සඳහා වෘත්තීය පුහුණු මාර්ගෝපදේශයන් ලබා දෙමින් ඔවුනගේ අනාගත සුභ සිද්ධිය උදෙසා කටයුතු කිරීම මෙහි අරමුණ වේ.
මේ යටතේ දැනට දරුවන් 120 ක් පමණ හෝටල් පාසල හරහා වෘත්තීය පුහුණුව ලබා දීමට සියලු කටයුතු සූදානම් කර ඇති අතර එම පුහුණුව අවසානයේ අදාල ක්ෂේත්‍රවල වෘත්තීයන්වලට අනුයුක්ත කිරීමට නියමිතය.

## 12. විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සම්බන්ධ වැඩසටහන්

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වසර ගණනක සිට ළමුන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා විශේෂ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරමින් සිටී. ඒ අනුව විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා පහත වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

- ළමා සංවර්ධන මධ්‍යස්ථාන වෙත ළමුන් යොමු කිරීම අවම කිරීම.
- විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් මට්ටමින් ක්‍රියාකාරී සැලසුම් 9 ක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

- නීතිය හා ගැටුනු ළමුන් පුනරුත්ථාපනය.
- මේ යටතේ බාලක යුක්තිය පසිඳලීමේ අධිකරණ ක්‍රියාවලියේදී පවත්නා ප්‍රායෝගික තත්ත්වයන් සම්බන්ධයෙන් විනිසුරුවරුන් දැනුවත් කිරීමේ තෙදින වැඩසටහනක් පැවැත්වීම, ඇප ලබා දිය හැකි වැරදි සිදු කරන ලද ඇප ගෙවීමට නොහැකිව බන්ධනාගාර ගතව සිටින දරුවන් සඳහා නීතිමය සහය ලබා දීමේ වැඩසටහන.
- මධ්‍යම හා දකුණු පළාත් සමීක්ෂණ මගින් හඳුනාගත් ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිටින සමාජ ගත කල හැකි ළමුන් හඳුනා ගැනීම.
- විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය පිළිබඳ ධාරිතා සංවර්ධන / දැනුවත් කිරීමේ වැඩසටහන්
- විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පුහුණු කරුවන් ලෙස නිලධාරීන් 47 ක් පුහුණු කිරීම. එම පුහුණු නිලධාරීන් මගින් දිස්ත්‍රික් 8 ක නිලධාරීන් 460 ක් පුහුණු කිරීමට කටයුතු කිරීම හැඳින්විය හැකියි.

# 6.6 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## හැඳින්වීම

1998 අංක 50 දරණ පනත මඟින් පිහිටවනු ලැබූ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සියලු ආකාරයේ ළමා හිංසන හා අපයෝජනය වැළැක්වීම සඳහාත් ළමුන් ආරක්ෂාව හා රැකවරණය සඳහාත් ජාතික මට්ටමින් ක්‍රියාත්මක ආයතනය වන අතර රජයට ළමා ආරක්ෂාවට අදාල ප්‍රතිපත්ති හා නීති සම්පාදනය වෙනුවෙන් උපදෙස් ලබාදීමද සිදු කරයි.

## ප්‍රධාන කාර්යභාරය

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 වගන්තිය ප්‍රකාරව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුල් කාර්යභාරයක් පැවරී ඇත.

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික, පරිපාලන හෝ වෙනත් ප්‍රතිසංස්කරණ සංවර්ධනය කිරීම, ළමුන්ට එරෙහි සාහසිකත්වය පිළිබඳ ජාතික දත්ත පදනම සංවර්ධනය සහ පවත්වාගෙන යාම, මහජනතාවගෙන් ළමා අපයෝජන සම්බන්ධ පැමිණිලි ලබා ගැනීම. විමර්ශන, මෙහෙයුම් සහ නඩත්තු කිරීම, ළමුන් සම්බන්ධ ළමා අපයෝජන නඩු ක්‍රියාවලිය අධීක්ෂණය හා නීතිය සමඟ ගැටෙන හා සම්බන්ධ වන ළමයින් සඳහා ආධාර, අධීක්ෂණය සහ පසු විපරම් සිදු කිරීම, ළමා ආරක්ෂක සේවා සහ පහසුකම් සැපයීම සඳහා අවම ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම ඊට ඇතුලත් වේ. එමෙන්ම ළමයාගේ උපරිම යහපත සඳහා ළමා අපයෝජන වැළැක්වීම හා අපයෝජනයට ගොදුරු වූ ළමයාට ප්‍රතිචාර දැක්වීමේ අරමුණු ඇතිව ජාතික වැඩසටහන් සංවර්ධනය සහ පැවැත්වීම. සියලු ආකාරයේ අපයෝජනවලින් ළමයාගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රමවේදයන් හා ළමා ආරක්ෂණ දැනුම ප්‍රචලිත කිරීම සඳහා ළමුන්, යෞවනයන්, වෘත්තිකයන් සහ මහජනතාව දැනුවත් කිරීම, තොරතුරු සහ අධ්‍යාපනය ලබා දීම හා ළමා ආරක්ෂණය හා ළමා සංවර්ධනය පිළිබඳ පාර්ශවකරුවන්ගේ රැස්වීම්, වැඩමුළු, සාකච්ඡා, සහ සංසද ආදිය පැවැත්වීම ද ප්‍රධාන කාර්යයන් අතර වේ.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30ට මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 1. 1929 ළමා උපකාරක දුරකතන සේවය

ළමා අපයෝජන සම්බන්ධ මහජන පැමිණිලි භාර ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ මඟින් කායික, මානසික, ලිංගික අපයෝජන මෙන්ම නොසලකා හැරීම්වලට අදාළ මහජන පැමිණිලි භාරගැනීම ද පැය 24 පුරාම සිදු කරයි. මේ වන විට 1929 දුරකතන සේවාව වෙත ඇමතුම් 87,720 ක් ලැබී ඇති අතර, පැමිණිලි 6,342 ක් ලැබී ඇත.

එම පැමිණිලි අතරින් ආරක්ෂාව හා රැකවරණය අවශ්‍ය බවට ලැබුණු පැමිණිලි 1,842 ක් වන අතර, කෲරත්වයට අදාල පැමිණිලි 1681ක් හා අනිවාර්යය අධ්‍යාපනය කඩවීම් හෝ ඊට අදාල පැමිණිලි 1389 ක් ලැබී තිබුණි.

### 2. පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන (සුරැකුම් පව්ව)

අනිවාර්ය අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සහ එම ළමුන් ළමා අපයෝජනයන්ගෙන් වැළැක්වීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම පාසල්වල පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම් අරමුණු වේ. මෙහිදී 2011/ අංක 17 චක්‍රලේඛය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වැඩසටහන සිදුකරයි. පාසල් ආරක්ෂණ කමිටු 717ක් ස්ථාපිත කර ඇති අතර, ODK (Open Data Kit) යටතේ ඇගයීම් ක්‍රියාවලියට ලියාපදිංචි පාසල් ගණන 978 කි.

### 3. විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය, අපරාධ නඩු කටයුතු පිළිබඳ නියාමනය, ළමා අපයෝජන සහ අධිකරණ ක්‍රියාදාමයන් සම්බන්ධ සයිබර් නියාමන කටයුතු සිදුකිරීම

ළමා අපයෝජනවලින් වින්දිත වූ ළමුන්ගේ රැකවරණය සැලසීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ළමා අපයෝජන සම්බන්ධව විශේෂ විමර්ශනයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත ප්‍රකාරව සිදු කරනු ලබයි. මේ වන විට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය අධිකරණයේ පෙනී සිටීම් 1567 ක් සම්පූර්ණ කර ඇත. එමෙන්ම නීති අංශය විසින් අධිකරණයේ පෙනී සිටීම් 28ක් සිදු කර ඇති අතර, පුද්ගලයින් 1,119කට නීතිමය සහාය ලබාදී ඇත. සයිබර් නිරීක්ෂණ පැමිණිලි 113ක් ලැබී ඇත.

### 4. ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනය වූ ළමුන් සඳහා සහාය වීම

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතභාවයට පත් වන ළමුන් ද්විතීයික වින්දිතභාවයට පත්වීම වැළැක්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ඒකකයේ හා දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ( රාගම) ළමා පියස පරිශ්‍රයේ නව ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය මඟින් ද ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සිදු කරයි. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 201 ක් අවසන් කර ඇති අතර, අධිකරණ නියෝග හා නීතිපතිවරයාගේ නියෝග මත සාක්ෂි සටහන් 128 ක් නිකුත් කර ඇත.

### 5. ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජයීය උපකාර සේවාව

වින්දිත ළමුන් ප්‍රමාණය අවම කිරීම හා ළමුන් අපයෝජනය වීමට ඇති අවදානම වැලැක්වීම, අධ්‍යාපනය සඳහා සහාය සහ කායිකව හා මානසික සෞඛ්‍ය ඉහළ නැංවීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මෙමඟින් ළමා කේන්ද්‍රීය මනෝ සමාජයීය සහායන් ළමයින්ට ලබා දෙයි. ඒ අනුව මේ වන විට ළමුන් 523ක් සඳහා මනෝසමාජීය සහාය හා මැදිහත්වීම් ලබා දී ඇති අතර, පසු විපරම් 393ක් සිදු කර ඇත. එමෙන්ම ඊට අමතරව මනෝ සමාජීය උපදේශන 135ක් හා සිද්ධි සම්මන්ත්‍රණ 03ක් පවත්වා ඇත. මේ වන විට දරා ඇති වියදම රු. මිලියන 0.112කි.

### 6. කැපකරු සත්කාර වැඩසටහන යටතේ සුනාමියෙන් විපතට පත් වූ ළමුන්ට උපකාර කිරීම සහ අධීක්ෂණය කිරීම

සුනාමි ව්‍යවසනයෙන් වින්දිතභාවයට පත්වූ ළමුන්ගේ භාරකාරිත්වය පරීක්ෂාවට ලක්කරමින් ළමුන්ගේ උපරිම යහපත තහවුරු කෙරෙන භාරකාරිත්වය හා රැකවරණය සඳහා නිර්දේශ සැපයීම සහ සැමට අධ්‍යාපනය යන තිරසර තේමාව යටතේ සුනාමි ව්‍යවසනයෙන් වින්දිත, ආන්තික හා අනාරක්ෂිතභාවයට පත්වූ ළමුන් සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම හා ඔවුන්ගේ අධ්‍යාපන අයිතීන් ආරක්ෂා කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මේ යටතේ දැනට ළමුන් 17 දෙනෙකු සඳහා අධ්‍යාපනික ආධාර ලබාදීම සිදුකරන අතර, සුනාමි මණ්ඩල 02 ක් පවත්වා ඇත. සමස්ත වියදම රු. මිලියන 0.442කි.

### 7. ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ14.(ග) වගන්තියට අනුව ළමයින් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරා ඇත. ඒ අනුව ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි දරුවන් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක්

හා ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා ඇත.

## 8. දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- **පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා "ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන" හා විශ්වවිද්‍යාල සිසුන් සඳහා "විශ්ව විද්‍යාල තානාපති" ජාතික වැඩසටහන**

ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින් හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. පාසල් තුළ ළමා අපයෝජන අවම කිරීම සඳහා ශිෂ්‍ය නායකයින්ගේ සහභාගිත්වය ලබා ගැනීම සහ පාසල් ප්‍රජාව ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදුකෙරේ.

විශ්ව විද්‍යාල තුළ ළමා ආරක්ෂාව පිළිබඳ ළමයින් සහ ප්‍රජාව දැනුවත් කිරීමට දායකත්වය ලබා ගැනීම සහ ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී දායකත්වය ලබා ගැනීම සහ ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රචලිත කිරීම ආදිය මෙයින් අපේක්ෂා කරයි.

නව ලියාපදිංචි පාසල් 456ක් වන අතර. දිස්ත්‍රික් ශිෂ්‍ය තානාපති පුහුණු වැඩසටහන් 02ක් පවත්වා ඇත. විශ්ව විද්‍යාල සිසුන් 2,262ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් පවත්වා ඇත. දරන ලද මුළු වියදම රු. මිලියන 0.524කි.

මෙම ප්‍රධාන වැඩසටහන්වලට අමතරව ආන්තික, අවදානම්සහගත, අවදානමට ලක්විය හැකි, ඇස නොගැටෙන ළමුන් සහ ළමා අපයෝජනයන්ට ගොදුරුවූවන් සඳහා අධ්‍යාපනික ආධාර හෝ අදාළ සහාය ලබාදීම, ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය සහ සන්නිවේදන වැඩසටහන්, සිත් සවිය: ශ්‍රී ලංකාවේ ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජීය සම්පත් සංචිතය ස්ථාපිත කිරීම, හා ළමා ආරක්ෂණය පිළිබඳ විශේෂ ප්‍රජාවන් සඳහා සිදු කරන වැඩසටහන, (වැවිලි, නාගරික, වතු, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ ප්‍රජාවන්, සංචාරක ප්‍රදේශ, සමාජීය වශයෙන් සංක්‍රමණික මව්වරුන්ගේ ළමුන්, වීදි ළමුන්, ආබාධිත ළමුන්, ළමා ශ්‍රමිකයින්) යනාදී වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- **අදාළ ළමා ආරක්ෂණ අංශ 10 තුළ ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ උපදේශනය, දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සහ මෙවලම් සංවර්ධනය කිරීම**

මෙම වැඩසටහන් යටතේ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන්, විද්‍යාපීය ගුරුසිසුන් හා කාර්යය මණ්ඩල සාමාජිකයන්, පෙද නිලධාරීන් ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් වඩාත් සංවේදී වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම මෙහි මූලික අරමුණ වේ.

මේ යටතේ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යාපනය ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් හා රජරට විශ්ව විද්‍යාලයේ අචාර්යවරුන් හා සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා ඇත.

- **ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීම**

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීම සහ ළමා කටයුතු ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණු වේ. මේ යටතේ එක් දින පුහුණු වැඩසටහන් 05ක් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 15ක් පවත්වා ඇත. දරන ලද වියදම රු. මිලියන 0.376 කි.

- **ළමුන්ට එරෙහි හිංසනය වැලැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ප්‍රජාපාදක වැඩසටහන්**

මෙම වැඩසටහන් යටතේ ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික වැඩසටහන් සහ ආගමික පූජ්‍ය, පූජක ප්‍රසාදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ වන විට රු. මි. 1.305ක වියදමක් දරමින් වැඩසටහන් 124ක් පවත්වා ඇත.

## 9. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මඟින් ළමා ආරක්ෂාව සඳහා ළමා /උපකාරක දුරකථන සේවාවේ මෙහෙයුම් කටයුතු සඳහා දරන ලද වියදම් රු. මිලියන 1.560 කි.

# 6.7 ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

## හැඳින්වීම

කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාවට නංවන ජාතික යාන්ත්‍රණයයි. ශක්තිමත් සංවිධාන ජාලයක් ඇති කරමින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ගේ අවශ්‍යතා සාමුහික ක්‍රියාවලියක් හරහා ඉටු කිරීමට ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය කටයුතු කරනු ලබයි.

## ප්‍රධාන කාර්යභාරය

ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික වශයෙන් ද සමාජීය වශයෙන් ද බලගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම මෙන්ම සියලුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රධාන කාර්යභාරයන් අතර වේ.
කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණදෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්. සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණදෙන කාන්තාවන් අරභයා විශේෂ වැඩසටහන් මෙන්ම සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද සිදු කරනු ලබයි. තවද කාන්තාවන්ට එකම සංවිධානයක් තුළ ක්‍රියාත්මක වීම සඳහා (Smooth Functioning) ප්‍රජා මූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධානගත කිරීම ද ප්‍රධාන කාර්යයන්ය.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 ට මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 1. ආදායම් උත්පාදන වැඩිදියුණු කිරිම

ප්‍රාදේශීය වශයෙන් බහුලව සම්පත් භාවිතා කරමින් වෙළඳපොළ ඉල්ලුමට සරිලන නිෂ්පාදන සිදු කිරිම සඳහා ශිල්පීය දැනුම ලබාදෙමින් කාන්තාවන්ගේ අර්ථික සංවර්ධනය අරමුණ කර ගත් වැඩසටහනකි.
මේ යටතේ අඩු ආදායම්ලාභි නාගරික කාන්තාවන් ,අඩු ආදායම්ලාභි කාන්තාවන්, ධීවර කාර්මාන්තය ආශ්‍රිත කාන්තාවන්, වතු ආශ්‍රිත කාන්තාවන්, ආබාධිත කාන්තාවන්, හා විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන්, සුවිශේෂී හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන්, දිගු කාලයක් බන්ධනාගාරගත වූවන්ගේ පවුල් ආපදාවට ලක්වූ කාන්තාවන් , නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන්, ස්ත්‍රී මූලික පවුල්වල කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සිදුවේ. වැඩසටහන් 47 ක් සඳහා රු.මිලි. 6.3 ක් වැය කර ඇත.

### 3. දැනුම ,ආකල්ප හා කුසලතා වර්ධනය කිරිම

සියලුම වයස් කාණ්ඩවලට අයත් කාන්තාවන් ගේ සුවිශේෂී අවශ්‍යතා හඳුනාගෙන එම අවශතා පරිපූර්ණ කර ගැනීමට මෙම වැඩසටහන සංවිධානය කෙරේ. මේ යටතේ

- **ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණු වැඩසටහන**
  වැඩසටහන් 29 ක් ක්‍රියාත්මක කරන ලද අතර වැයවූ මුදල රු.මිලි. 0.472 කි.
- **ළමා නිවාසවල සිට ඉවත්වන අවු. 18 ඉක්ම වූ ගැහැනු ළමුන් සමාජගත කිරිම සඳහා NVQ මට්ටමේ හෙද පුහුණුව ලබාදීම හා අවශ්‍ය මූලික පුහුණුව ලබාදීම.**
  මේ යටතේ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර වැයවූ මුදල රු.මිලි. 0.731 කි.

## 4. වෙළඳපොළ ප්‍රවර්ධනය සහ කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිපොළ

- ජාතික මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අලෙවි ප්‍රවර්ධනය සඳහා කාන්තා නිෂ්පාදන අලෙවි පොළ ක්‍රියාත්මක කෙරේ**.** එමෙන්ම ස්ථිර අලෙවි ස්ථාන නොමැති අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා ජංගම අලෙවි කුටි ලබාදීම සිදුවේ. වැය කළ මුදල රු.මිලියන 0.180

## 5. සුවිශේෂ වැඩසටහන්

විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණ දෙන කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන වැඩසටහනකි. මේ යටතේ

- අයවැය යෝජනා අංක 48.1 යටතේ වැන්දඹුවන් ගෘහ ව්‍යවසායකවන් ලෙස ශක්තිමත් කිරිම. ව්‍යාපෘති 124 කට මිලියන 11.8 වැය කර ඇත.
- ගෘහමූලික කාන්තා පවුල් බලගැන්වීම සඳහා වූ ජාතික මධ්‍යස්ථානය මඟින් ගෘහමූලික කාන්තාවන් සඳහා විශේෂ ආර්ථික උත්පාදන වැඩසටහන් 03ක් ක්‍රියාත්මක කිරිම වැය වූ මුදල රු. මිලියන 0.968 කි.

## 6. සමාජීය වශයෙන් සවිබල ගැන්වීම.

කාන්තාවන් වීම නිසාම මුහුණදෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මෙහි අරමුණවේ. මේ යටතේ මධස්ථාන **ක්‍රියාකාරිව පවත්වා ගෙන යාම සහ නඩත්තුව සිදු කෙරේ.**

- තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන

කාන්තාවන්ගේ ආරක්ෂාව සහ අයිතිවාසිකම් තහවුරු කිරීම යන අරමුණ පෙරදැරි කර ගනිමින් දිවයිනේ තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන 10ක් පවත්වාගෙන යනු ලැබේ.

- ගම්පහ, මොණරාගල, රත්නපුර - අමාත්‍යාංශය
- කොළඹ, මඩකළපුව, අනුරාධපුර, මාතර - කාන්තා පිහිට ආයතනය
- යාපනය, මුලතිව -Jaffna Social Action Center
- අනුරාධපුර (තඹුත්තේගම) -ආබාධිත කාන්තා සම්මේලනය

මෙම රැකවරණ මධ්‍යස්ථාන වෙත ගෘහස්ත හිංසනයන්ට ලක්වූ හා ලිංගික අතවරයන්ට ගොදුරුවූ කාන්තාවන් අධිකරණ නියෝග මත, පොලීසිය, රෝහල් විසින් යොමු කරනු ලැබේ. වින්දිත කාන්තාවන් නැවත සමාජගත වූ පසු ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා නේවාසික රැකවරණය ලබන කාලසීමාව තුළදී ස්වයං රැකියා පුහුණුව ලබා දෙනු ලැබේ. ඔවුන් සමාජගතවීමෙන් පසුද පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබේ. කාන්තාවන් 252 දෙනෙකු සඳහා සේවාවන් සපයා ඇති අතර, දරන ලද වියදම රු. මිලියන 7.718කි.

- උපදේශන මධ්‍යස්ථාන

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය යටතේ දිවයින පුරා උපදේශන මධ්‍යස්ථාන 12ක් ක්‍රියාත්මක වේ. එම උපදේශන මධ්‍යස්ථාන හරහා උපදේශන නිලධාරීන් හා උපදේශන සහකාර නිලධාරීන් මඟින් කාන්තා, පිරිමි හා ළමා යන සියලු පාර්ශවයන්ට උපදේශන සේවාව ලබාදීම හා උපදේශනය ලබාගත් සේවාදායකයන්ගේ පසුවිපරම් කටයුතු සිදු කරයි. මේ වන විටසේවාදායකයින් ගණන 1905කි. දරා ඇති වියදම රු. මිලියන 0.765කි.

- **උපදේශන දැනුවත් කිරීමේ** වැඩසටහන

zoom තාක්ෂණයෙන් උපදේශන නිලධාරි හා උපදේශන සහකාර නිලධාරින් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 5 සිදුකර අවසන්ය.

## 7. දින සැමරුම

- **ජාත්‍යන්තර කාන්තා දින ජාතික සැමරම**

ජාතික සැමරුම් උත්සවය " ඇය දැයේ අභිමානයයි " තේමාව යටතේ 2023 මාර්තු මස 08 වන දින කාන්තාවන් 300 කගේ සහභාගිත්වයෙන් බත්තරමුල්ල වෝටර්ස් එජ් හිදී ගරු ජනාධිපතිතුමන් සහ ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙම උත්සවය පවත්වන ලදී. දිස්ත්‍රික් 25 නියෝජනය කරමින් කාන්තා කාර්ය සංවිධානයන්හි ව්‍යවසායක කාන්තාවන් 25 ක් ඇගයීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානත්මතාවය හා කාන්තාවන් සවිබලගැන්වීමේ ජාතික ප්‍රතිපත්තිය එළිදැක්වීම හා දේශනය, විවිධ අංශ නියෝජනය කරමින් දක්ෂතා දක්වා ඇති විශිෂ්ඨ කාන්තාවන් 04 දෙනෙක් ඇගයීම සහ මෙවර උසස් පෙළ විශිෂ්ඨ ප්‍රතිඵල දක්වා සරසවි වරම් හිමිකරගත් විශේෂ අවශ්‍යතා සහිත සිසුවිය ඇගයීම ද සිදු කෙරිණි. තවද කාන්තා සවිය, අරුණෝදය සඟරා එළිදැක්වීම ද සිදු කරන ලදී.

- **මානසික සෞඛ්‍ය දිනය**

ඔක්තෝබර් 10 දිනට යෙදී තිබෙන මානසික සෞඛ්‍ය දින වෙනුවෙන් මෙම සැමරුම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාව පුරා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් විසිර සිටින උපදේශන සේවා සපයන උපදේශන නිලධාරීන් හා උපදේශන සහකාරවරුන්ගේ දැනුම, ආකල්ප ප්‍රවර්ධනය කිරීම සහ සාමූහිකව කටයුතු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට නියමිතයි. එමෙන්ම උපදේශන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳ අවධානය යොමු කිරිම, උපදේශන ගැටලු හඳුනාගෙන දීපව්‍යාප්තව උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි කරුණු පදනම් කරගෙන දේශන පැවැත්වීමට කටයුතු කෙරේ.

## 8. අධීක්ෂණය හා පසුවිපරම

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සියලු වැඩසටහන් මාණ්ඩලික නිලධාරීන්ගේ අධීක්ෂණය මත දිස්ත්‍රික් මට්ටමින් පසුවිපරම් හා ප්‍රගති සමාලෝචනය සිදු කරයි. ප්‍රාදේශීය මට්ටමින් සිදු කරන වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම මෙහිදී සිදු කෙරේ. මේ වන විට අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන රැස්වීම් 05ක් සිදු කර ඇත.

## 9. කාන්තා සංවිධාන ජාලය ගොඩනැගීම

කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ග්‍රාම සේවා වසම් මට්ටමින් වයස අවුරුදු 18 වැඩි සියලුම කාන්තාවන් ඒකරාශී කර ගනිමින් කාන්තා කාර්යය සංවිධාන පිහිටුවා ගන්නා අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එම කාන්තා නිලධාරින්ගේ සහභාගිත්වයෙන් ප්‍රාදේශීය කාන්තා බලමණ්ඩල පිහිටුවා ඇත. කාන්තාවන් දිස්ත්‍රික් මට්ටමින් ඒකරාශී කිරිම සඳහා දිස්ත්‍රික් 25ටම සම්බන්ධ කාන්තා නිලධාරින් මඟින් දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩල පිහිටුවයි. මෙම ජාලය මඟින් සමස්ත කාන්තා ප්‍රජාවම රටේ සංවර්ධනයට දායක කර ගැනීමත්, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් සිදු කරන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදු කරනු ලබයි.

- කාන්තා කාර්යය සංවිධාන (වසම් මට්ටමින් ) **12,881**
- ප්‍රාදේශීය කාන්තා බලමණ්ඩල (ප්‍රාදේශීය මට්ටමින්) **316**
- දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩල (දිස්ත්‍රික් මට්ටමින්) **25** ද සක්‍රියව පවතී

## 2023 විදේශීය අරමුදල් භාවිතයෙන් සිදුකරනු ලබන ව්‍යාපෘති

- ව්‍යවසායකත්වය, නායකත්වය හා ජාලකරණය හරහා කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා JICA (ජපන් අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය) මඟින් කාන්තා කාර්ය සංවිධාන ප්‍රතිසංවිධානය හා කාන්තා ව්‍යවසායකයන් බලගැන්වීමේ ව්‍යාපෘති අම්පාර හා මොණරාගල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. ව්‍යාපෘති කාල සීමාව 2023 - 2027 වර්ෂය දක්වා වේ

- තාවකාලික රැකවරණ මධ්‍යස්ථාන සඳහා උපකරණ හා ද්‍රව්‍යමය ආධාර සැපයිමේ ව්‍යාපෘතිය හා සමාජ ආර්ථික අර්බුදයෙන් වැඩිම පීඩාවට පත්වූ කාන්තාවන් සඳහා හදිසි සහන සැලසීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් UN Women (එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය) මඟින් තාවකාලික රැකවරණ මධ්‍යස්ථාන 10 සඳහා ආහාර, ඇඳුම්, ප්‍රථමාධාර, සනීපාරක්ෂක ද්‍රව්‍ය, ලිපිද්‍රව්‍ය යන අංශ යටතේ ද්‍රව්‍යමය ආධාර ලබාදීම, තාවකාලික රැකවරණ මධ්‍යස්ථාන 11ක් නිරීක්ෂණය, වවුනියා, මොණරාගල, අම්පාර, කොළඹ, මුලතිව් යන දිස්ත්‍රික්කවලින් තෝරාගත් ව්‍යවසායක කාන්තාවන් 600 සඳහා පුහුණු වැඩසටහන් 15 ක් පැවැත්වීම ආදිය සිදු කර ඇත. ව්‍යාපෘති කාල සීමාව 2023 අගෝස්තු මස සිට 2024 ජනවාරි මස දක්වා වේ.
- නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිරසර ප්‍රජාමූලික පවුල් සවිබල ගැන්වීම- Semaul (සෙමාවුල් ගෝලීය පදනම) මඟින් අවබෝධතා ගිවිසුම අත්සන් කිරිම, 2023 අගෝස්තු 25 සමාරම්භක උළෙල පැවැත්වූ අතර, ශාන්තිපුර පාසලේ පිළිසකර කිරීම් සිදු කර ඇත. මෙය 2022-2026 වර්ෂ සඳහා ක්‍රියාත්මක වේ.
- ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිපාදන හදිසි ආධාර ව්‍යාපෘතිය - වෘත්තීය හා ධාරිතා පුහුණු ලබාදීම හා අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙමඟින් සිදුවේ. මේ සඳහා ADB (ආසියානු සංවර්ධන බැංකුව) විසින් රු. මි. 0.443 ක මුදලක් වැය කර ඇති අතර, මෙය 2022-2024 වර්ෂ සඳහා ක්‍රියාත්මක වේ.
- කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීමේ ව්‍යාපෘතිය- UNFPA (එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල) වාර්ෂික ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වේ. කාන්තා රැකවරණ මධ්‍යස්ථාන සඳහා CDMA දුරකථන 42 ක බිල් ගෙවීම වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පාඨමාලාව පැවැත්වීම, තාවකාලික රැකවරණ මධ්‍යස්ථාන ක්ෂේත්‍ර නිරීක්ෂණය. මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 0.208කි.
- ජාතික මට්ටමින් උපදේශන විශ්ලේෂණ නියමු ව්‍යාපෘතිය හා ඒ ආශ්‍රිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.- Asian Foundation (ආසියානු පදනම) මඟින් Zoom තාක්ෂණය ඔස්සේ උපදේශන නිලධාරීන්, උපදේශන සහකාර සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් 05 ක් පැවැත්වීම සිදු කර ඇත.

# 6.8 ජාතික කාන්තා කමිටුව

## හැඳින්වීම

1993 මාර්තු 08 දින පිහිටුවනු ලැබූ ජාතික කාන්තා කමිටුව මඟින් කාන්තා ප්‍රඥප්තියේ නිර්දේශ ක්‍රියාවට නංවනු ලබයි. කාන්තාවන්ගේ සුභසිද්ධිය, ආරක්ෂාව, රැකවරණය වෙනුවෙන් ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කරනු ලබන ජාතික ආයතනයයි.

## ප්‍රධාන කාර්යයභාරය

සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකික සමාජයක් බිහි කිරීමේ අරමුණින් පිහිටුවන ලද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්යය වන්නේ ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම වේ. මේ සඳහා ජාතික කමිටුව මගින් නිර්දේශ හා සහාය ලබා දීම හා අධීක්ෂණය කර ඇගයීම සිදු කරනු ලබයි. ඒ අනුව ජාතික කාන්තා කමිටුව තුළ පැමිණිලි මධ්‍යස්ථානයක් සහ පැය 24 පුරාම අවශ්‍ය සේවා සපයන 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව ක්‍රියාත්මක වේ.

- **පැමිණිලි මධ්‍යස්ථානය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ඇති වන වෙනස්කම්, අසාධාරණකම් යන අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලබා ගැනීමටත් ඒවා සංනිරීක්ෂණය කොට විසඳුම් ලබා දීමේ කාර්යය සඳහා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන වෙත යොමු කිරීමත්, අවශ්‍ය අවස්ථාවන්හිදී නීති ආධාර, උපදේශන සේවා ඇතුළු සහන සැලසීමත් පැමිණිලි මධ්‍යස්ථානයේ කාර්යභාරය වේ. පැමිණිලි මධ්‍යස්ථානය වෙත පැමිණ, ලිපි මඟින්, විද්‍යුත් තැපැල හා දුරකථන ඇමතුමක් මඟින් කාර්යාල වේලාවන් තුළදී පැමිණිලි භාරදීමට හැකියාව ඇත. පැමිණිලි මධ්‍යස්ථානය වෙත මේ දක්වා ලැබුණු සම්පූර්ණ පැමිණිලි සංඛ්‍යාව 288ක් පමණ වේ. මෙම පැමිණිලිවල ස්වරූපය අනුව අදාළ පරිදි සේවාවන් ලබා දීම සිදු කර ඇත.

- **1938 කාන්තා උපකාරක දුරකථන සේවාව**

ජාතික කාන්තා කමිටුවේ කාර්යභාරය තවදුරටත් කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත 1938 ගාස්තු රහිත උපකාරක දුරකථන සේවාව සෑම දිනකම, පැය 24 පුරා භාෂා ත්‍රිත්වයෙන්ම ක්‍රියාත්මක වේ. මෙම සේවාවට අදාළව පැමිණිලි භාරගැනීම,විසඳුම් ලබා දීම හා පසු විපරම් කිරීම, උපදේශනය සිදු කිරීම, නීති උපදෙස් ලබා දීම හා අදාළ වෙනත් ආයතන වෙත පැමිණිලිකරුවන් යොමු කිරීම යන කාර්යයන් ඉටු කරනු ලබයි. ඒ අනුව 2023 වර්ෂයේ සැප්තැම්බර් මාසය අවසාන වන විට ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව 2,612ක් වන අතර, ඉන් 408ක් ම මනෝ සමාජයීය උපදේශනය සඳහා උපදේශන නිලධාරීන් වෙත යොමු කර ඇත. තවත් පැමිණිලි 656ක් නීති අංශ වෙත ද, පැමිණිලි 535ක් වනිතා සංවර්ධන නිලධාරීන් වෙත ද යොමු කර ඇත. පොලිස් ස්ථාන වෙත යොමු කළ පැමිණිලි සංඛ්‍යාව 235ක් වන අතර, පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ මූලස්ථාන වෙත තවත් පැමිණිලි 41ක් යොමු කර ඇත.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30ට මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 1. දැනුවත් කිරීමේ වැඩසටහන්

- **උපකරක පන්ති ඇතුළු උසස් අධ්‍යාපන ආයතන ළමුන් සයිබර් අපරාධ, පොදු ප්‍රවාහනයේ දී සිදුවන හිංසනය හා සෞඛ්‍ය අධ්‍යාපනය සම්බන්ධව දැනුවත් කිරීම**

පොදු ප්‍රවාහනයේ දී හා අන්තර්ජාලය තුළ නව යෞවන යෞවනියන්ට සිදුවන හිංසනයන් වැළැක්වීම හා නව යොවුන්විය තුළ ඔවුන් මුහුණ දෙන අභියෝග ජය ගැනීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණින් කුරුණෑගල දිස්ත්‍රික් වැඩසටහන ප්‍රතිලාභින් 200 දෙනෙකු සඳහා පවත්වන ලදී.

- **රැකියා ස්ථානයේ සිදු වන ලිංගික හිංසනය අවම කිරීම සඳහා කාර්මික ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සේවක සේවිකාවන් දැනුවත් කිරීම**

රැකියා ස්ථානයන්හි කාන්තා හිංසනයන අවම කිරිම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඇතුළු පෞද්ගලික ආයතනවල රැකියා ස්ථානයන්හි කාන්තා හිංසනය අවම කිරීම පිළිබඳව පළමු වැඩසටහන රත්මලාන 'ලංකාසෝයි' ආයතනයේ සේවක සේවිකාවන් 175 දෙනෙකු දැනුවත් කිරීම සඳහා පවත්වන ලදී.

### 2. ධාරිතා සංවර්ධන වැඩසටහන්

- **දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාන්තා හා ළමා සංවර්ධන ඒකකයන්හි නිලධාරීන් පුහුණුකරුවන් ලෙස ධාරිතා සංවර්ධනය කිරීම**

ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් සයිබර් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ පුහුණුවක් එම නිලධාරීන් හට ලබා දීම මෙහි මූලික අරමුණ විය. ඒ අනුව මෙම 2023 වර්ෂයේ සැප්තැම්බර් මාසය වන විට වැඩසටහන් දෙකක් කළුතර, කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි පවත්වන ලදී. කළුතර දිස්ත්‍රික් වැඩසටහන හා කුරුණෑගල දිස්ත්‍රික් වැඩසටහන ප්‍රතිලාභීන් 120 දෙනෙකු සඳහා පවත්වන ලදී.

- **දේශපාලනයේ කාන්තාවන් බලගැන්වීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ කාන්තා බලමණ්ඩලවල නියෝජිතයින්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන්**

දේශපාලනයට අවතීර්ණ වීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්පවලින් හෙබි කාන්තා නායිකාවන් බිහිකිරිම හා දේශපාලනයට අවතීර්ණ වීම සඳහා කාන්තාවන් දිරිමත් කිරීමේ අරමුණින් මෙම වැඩසටහන් මාලාවේ එක් වැඩසටහනක් දින දෙකක් පැවැත්වෙන අතර එහි පළමු දෙදින වැඩසටහන ගම්පහ දිස්ත්‍රික්කයේ දී පවත්වන ලදී.

### 3. ප්‍රතිපත්තිමය වැඩසටහන්

- **පාර්ලිමේන්තු හා පළාත් සභා මැතිවරණයන්හි දී කාන්තාවන් සඳහා කෝටාවක් ලබා දීමට කටයුතු කිරීම**

කාන්තාවන්ගේ ආර්ථික හා සාමාජීය වශයෙන් සංවර්ධනය කරමින් හා විෂමතාවයන් අවම කරමින් කාන්තාවන් විධිමත් දේශපාලන ක්‍රියාකාරිනියන් කරවීමේ අරමුණින් මෙම වර්ෂය තුළ මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සමග සාකච්ඡා පවත්වා ඇත.

# 6.9 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය සහතික කිරීම අරමුණු කොටගෙන, ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා සෑම දිළිඳු පුද්ගලයෙකු තුළම පවතින සැඟවුණු විභවතාවන් යටපත් කරගෙන ඇති බාධක දුරලමින්, එම පවුල් සවිබලගැන්වීම, සමාජ ආරක්ෂණය සහ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 අංක 2 දරන දිවිනැගුම (සංශෝධිත) පනතින් සංශෝධිත හා 2013 අංක1 දරන දිවිනැගුම පනත මඟින් ස්ථාපිත කර ඇත.

## කාර්යභාරය

- පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් ආර්ථික සංවර්ධන, ජීවනෝපාය සංවර්ධන , ව්‍යවසාය සංවර්ධන හා සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- "අස්වැසුම" සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ හඳුනාගෙන ඇති පවුල් ආර්ථික, සාමාජීය හා මානසික වශයෙන් සවිබලගැන්වීමට කටයුතු කිරීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් උත්පාදන මාර්ග හා ජීවනෝපාය මාර්ග නගාසිටුවීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම හා එම පවුල්වල සමාජ ආරක්ෂණය සැලසීම.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 1. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

- මෙම වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධනය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 01 ක් පැවැත්වීම.
- සමාජ ආරක්ෂණ අරමුදල යටතේ අතිරේක බෝග වගාව අක්කර 755 ක සිදුකිරීම. (ප්‍රතිලාභීන් 1,488, රු. මිලියන 19.70), කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය යටතේ කජු අපනයන ගම්මාන ව්‍යාපෘතිය හරහා වන කජු සැකසුම් මධ්‍යස්ථාන 54 ක් (රැකියා අවස්ථා 100) සංවර්ධනය කිරීම (වනාතවිල්ලුව) සිදුකර ඇත. (රු. මිලියන 9.71)

### 2. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

- කැකිරාවෙහි සුව බොජුන්හල් 1 ක් ස්ථාපිත කර ඇති අතර ව්‍යවසායකයින් 11,155 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 275 ක් දිස්ත්‍රික්ක 08 ක පැවැත්වීම
- වෙළඳ ප්‍රදර්ශන 606 ක් පැවැත්වීම
- මධ්‍යස්ථාන 7ක ජපන් භාෂා පුහුණු වැඩසටහන් ආරම්භකර ඇති අතර JLPT - සිසුන් 238 කින් 75 ක් සහ , N5 - සිසුන් 51 කින් 25 ක් සමත්වී ඇත.
- මිනි ෆුඩ් සිටි 25 ක් ආරම්භ කිරීම සඳහා ස්ථාන හඳුනා ගෙන ඒවා ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී. (ලෝක ආහාර වැඩසටහන)
- තරුණ තරුණියන් 8,000ත් වෙනුවෙන් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම (Y-lead ආයතනය, රු. මිලියන 7.00)

## 3. සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන

- මත්ද්‍රව්‍ය සහ දුම්පානය වැලැක්වීම, ගෘහ කළමනාකරණය සහ "සතුටු පවුල" වැඩසටහන් 550ක් (ප්‍රතිලාභීන් 31,813) පැවැත්වීම, සනීපාරක්ෂක වැඩසටහන් 1,020 පැවැත්වීම (ප්‍රතිලාභීන් 82,707), සමාජ සංවර්ධන නිලධාරින් සඳහා කුසලතා පුහුණු වැඩසටහන් 121ක් පැවැත්වීම (නිලධාරින් 4,061 ). (භාණ්ඩාගාර ප්‍රතිපාදන)
- වෙනත් මූල්‍ය අනුග්‍රහයන් යටතේ මත්ද්‍රව්‍ය සහ දුම්පානය වැලැක්වීම, ගෘහ කළමනාකරණය සහ "සතුටු පවුල" වැඩසටහන් 4,435ක් (ප්‍රතිලාභීන් 233,378, රු. මිලියන 10.44) පැවැත්වීම, සනීපාරක්ෂක වැඩසටහන් 15,576 පැවැත්වීම (ප්‍රතිලාභීන් 107,696, රු. මිලියන 2.09), සමෘද්ධි කැකුළු ළමා සමාජ, සංස්කෘතික සහ සාක්ෂරතා වැඩසටහන් 4,265ක් (ප්‍රතිලාභීන් 192,596, රු. මිලියන 14.41) පැවැත්වීම, ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන් 3,904ක් (ප්‍රතිලාභීන් 201,747, රු. මිලියන 26.55) පැවැත්වීම, සමාජ සංවර්ධන නිලධාරීන්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන් 443ක් (ප්‍රතිලාභීන් 754,801, රු. මිලියන 0.75) පැවැත්වීම, ප්‍රගති සමාලෝචන වැඩමුළු 279ක් (රු. මිලියන 3.09) පැවැත්වීම.

## 4. ප්‍රජාමූල සංවිධාන වැඩසටහන

- මෙම වැඩසටහන යටතේ සවිබලගැන්වීම සඳහා ආර්ථික සංවිධාන 294ක හඳුනාගැනීම සහ දිස්ත්‍රික් කමිටු රැස්වීම් 9ක් පවත්වා ඇත.
- සමාජ සංවර්ධන අරමුදල හරහා දිස්ත්‍රික් කමිටු රැස්වීම් 25 ක් පැවැත්වීම (රු. මිලියන 0.70), ප්‍රජාමූල නායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් 332 ක් පැවැත්වීම (රු. මිලියන 1.20), දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ ක්‍රීඩා වැඩසටහන් 9 ක් පැවැත්වීම (ප්‍රතිලාභීන් 6,765, රු. මිලියන 0.90), ජාතික සම්මේලනයට සමගාමීව සමෘද්ධි උත්තම ප්‍රජා නායකයින් ඇගයීම, සමෘද්ධි ජන අභිමානී ව්‍යවසායකයින් ඇගයීම, සමෘද්ධි කොඩි ඇගයීමේ වැඩසටහන හා තාරුණ්‍යයට සොඳුරු ඇමතුමක් ක්‍රීඩා වැඩසටහනේ ජයග්‍රාහී කණ්ඩායම ඇගයීම (රු.මිලියන 7.50).

## 5. තොරතුරු තාක්ෂණ වැඩසටහන

සමෘද්ධි නිලධාරීන් සඳහා තොරතුරු තාක්‍ෂණ වැඩසටහනක් පැවැත්වීම සහ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල 335 ක් සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම, A+ පුහුණු වැඩසටහන - SLIDA ආයතනයෙහි පැවැත්වීම, වෙනත් IT පුහුණු වැඩසටහන් 7 ක් පැවැත්වීම (රු. මිලියන 3.09)

## 6. මානව සම්පත් සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධනයට අදාළ ව්‍යාපෘති සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා විෂයානුබද්ධ වැඩසටහන් 7ක් සහ ඩිප්ලෝමා 2ක් පැවැත්වීම සිදුකොට ඇත. ධාරිතා සංවර්ධන වැඩසටහන් 3 ක් පවත්වා ඇති අතර ඒ සඳහා රු. මිලියන 1.47 කි. (භාණ්ඩාගාර ප්‍රතිපාදන)

## 7. මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ සමෘද්ධි E news papers 6 ක් නිකුත් කිරීම, "සමෘද්ධි උදානය" රූපවාහිනී වැඩසටහන් 20 ක් විකාශය කිරීම සිදුකොට ඇති අතර වැයකොට ඇති මුදල රු. මිලියන 6.65 කි. (භාණ්ඩාගාර ප්‍රතිපාදන)

## 8. සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන

ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 06 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 75ක් පැවැත්වීම, 2022 කාර්ය සාධන වාර්තාව සහ මහ බැංකුව සඳහා මධ්‍ය වාර්ෂික වාර්තාව සකස්

කිරීම, "අස්වැසුම" පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම සිදුකොට ඇති අතර වැයකර ඇති මුදල රු.මිලියන 0.57 කි. (භාණ්ඩාගාර ප්‍රතිපාදන)

## 9. සමෘද්ධි සහනාධාරය ලබාදීම

ජනවාරි සිට ජූනි දක්වා නිත්‍ය ප්‍රතිලාභීන් - 1,637,672, අමතර ගෙවීම් - 1,637,672, පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් - 719,666 සඳහා සමෘද්ධි සහනාධාරය ලබාදී ඇති අතර ජූලි මාසයේ දී අස්වැසුම ප්‍රතිලාභ නොලබන සමෘද්ධිලාභීන් - 368,310 ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත.

*ජනවාරි සිට ජූනි දක්වා ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත දීමනා ගෙවීම සිදුකොට ඇති අතර ජූලි මස සිට "අස්වැසුම" වැඩසටහනට ඇතුළත් කිරීමට ඉල්ලුම්කර ඇති සහ දැනට තෝරාගෙන නොමැති සමෘද්ධි ප්‍රතිලාභීන් 393,094 දෙනෙකුට " අස්වැසුම" වැඩසටහන යටතේ ඇති අභියාචනා සහ විරෝධතා සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අවසන් වන තුරු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ප්‍රතිලාභ ගෙවීමට කැබිනට් තීරණ අංක PS/NC/EAD/148/2023 මඟින් අනුමැතිය ලැබී ඇත.

## 10. සමෘද්ධි බැංකු සහ ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන

- සමෘද්ධි බැංකු සහ ක්ෂුද්‍ර මූල්‍ය අරමුදල යටතේ ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන හරහා ණය 174,586 ක් ලබා දී ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 18,242.54 කි.
- බැංකු සහ බැංකු සංගම් නිලධාරීන් සඳහා ගිණුම්කරණය, ව්‍යාපාර අධ්‍යයනය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් 9ක් (ප්‍රතිලාභීන් 455) පැවැත්වීම ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අරමුදලෙහි මූල්‍ය අනුග්‍රහයෙන් සිදුකර ඇති අතර ඒ සඳහා වැයකොට ඇති මුදල රු. මිලියන 6.77 කි.

## 11. සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ වැඩසටහන

සමාජ ආරක්ෂණ අරමුදල යටතේ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ වැඩසටහන හරහා ප්‍රතිලාභීන් 94,615 සඳහා රු. මිලියන 886.67 ප්‍රතිලාභ ලබාදී ඇති අතර "සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 335,559 ක් සඳහා රු. මිලියන 463.03 ක ප්‍රතිලාභ ලබාදී ඇත.

## 12. නිවාස සංවර්ධන වැඩසටහන

නිවාස ලොතරැයි අරමුදල යටතේ ක්‍රියාත්මක වන නිවාස සංවර්ධන වැඩසටහන හරහා නිවාස ඒකක 4,145 ක් සඳහා රු. මිලියන 1,020.75 ක ප්‍රතිලාභ ලබාදී ඇත.

## 13. වෙනත් සංවර්ධන වැඩසටහන්

- 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා දරුවන් 62,934 ක් සඳහා අභ්‍යාස පොත් ලබාදීමේ වැඩසටහන් 605 ක් පවත්වා ඇත. (වියදම රු. මිලියන 15.02)
- පෙර පාසල් 345 ක දරුවන් 6,900 ක් සඳහා පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ලෝක ආහාර වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 4,715 ක් සඳහා එක් ප්‍රතිලාභියෙකුට රු.22,500 බැගින් ආධාර ලබාදී ඇත. (වියදම රු. මිලියන 106.9)
- ප්‍රජාමූල සමෘද්ධි සිසුන් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ සිසුන් 8,883 ක් සඳහා පාසැල් පොත් ලබා දීම. (වියදම රු. මිලියන 18.00, ජාතික සමාජ සංවර්ධන අරමුදල)
- ප්‍රජාමූල සමෘද්ධි සිසුන් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ සිසුන් 62,000ක් සඳහා පාසැල් පොත් ලබා දීම. (වියදම රු. මිලියන 11.55, ප්‍රජා මූල සංවිධාන අරමුදල)

# 6.10 සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)

## හැඳින්වීම

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේ පත්කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර ආන්තිකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් රටේ ජන කොටස්වලට වඩාත් යහපත් වටපිටාවක් ගොඩනැගීමේ අරමුණින් යුතුව මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

## කාර්යභාරය

- ආබාධ සහිත ප්‍රජාව පුනරුත්ථාපනය, පූර්ණ කාලීන නේවාසික රැකවරණය ලබාදීම හා සවිබලගැන්වීම
- මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මැදිහත්වීම
- දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ කටයුතු සිදු කිරීම
- වත්මන් සමාජ ගැටළු සම්බන්ධයෙන් පර්යේෂණ/සමීක්ෂණ පැවැත්වීම, මැදිහත්වීම සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 1. ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම

අවුරුදු 16-35 අතර වයසේ පසුවන ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම අරමුණු කර ගනිමින් වෘත්තීය පුහුණු ආයතන 11ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ. මේ යටතේ අභ්‍යාසලාභීන් 473ක් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම හා දෛනික දීමනා ලබා දීම සිදු කර ඇත.

### 2. ආබාධ සහිත තරුණ තරුණියන්ගේ පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධනය

වයස අවුරුදු 14-30ත් අතර සිටින ආබාධ සහිත තරුණ තරුණියන් අනාගතයේ වෘත්තීය පුහුණුවට යොමු කරවීම සඳහා ක්‍රියාත්මක මෙම වැඩසටහන යටතේ 38 දෙනෙකුගේ කුසලතා සංවර්ධනය සිදු කරමින් පවතී.

### 3. ආබාධ සහිත ළමුන් සඳහා කල්තියා මැදිහත් වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.

මාස 06 සිට අවුරුදු 16 දක්වා ආබාධ සහිත දරුවන්ගේ ආබාධ හඳුනාගෙන ආබාධ අවමකරමින් ඔවුන් සංවර්ධනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන ආයතන 02ක් මගින් ළමුන් 119ක් සඳහා සේවා සපයයි.

### 4. භාරකරුවන් අහිමි ආබාධ සහිත පුද්ගලයන් සඳහා ජීවිත කාලය පුරා රැකවරණය සැපයීම

දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන රැකවරණ මධ්‍යස්ථාන 02 ක් හරහා ආබාධ සහිත පුද්ගලයන් 88ක් සඳහා රැකවරණය ලබා දේ.

### 5. ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා මූල්‍යාධාර සැපයීම

දිවයින පුරා ක්‍රියාත්මක වන ආයතන 27 ක් පවත්වාගෙන යාම සඳහා ආධාර ලබා දීම හා එම ආයතනවල සේවාලාභීන් 225 ක් සඳහා ආධාර ලබා දීම සිදු කර ඇත.

## 6. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම

පුවක්පිටිය ජයවිරු සමාධි ආයතනය හරහා මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් 77ක් පුනරුත්ථාපනය කිරීම හා දිස්ත්‍රික් මට්ටමින් මත් නිවාරණ වැඩසටහන් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.

## 7. ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා සැපයීම

- ආබාධ සහිත පුද්ගලයින් 10 සඳහා ආධාරක උපකරණ ලබාදීම.
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා පුනරුත්ථාපන සැලසුම් 1561ක් සකස් කර ඇත.
- ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ "ස්වශක්ති" කණ්ඩායම් රැස්වීම් 1,460 ක් පවත්වා ඇත.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 3.49 ක් වැය වී ඇත.

## 8. නිලධාරීන් සඳහා පුහුණුව ලබා දීම

නිලධාරින් 305 ක් සඳහා පුහුණු වැඩසටහන් 14 ක් පවත්වා ඇති අතර වියදම රු.මිලියන 1.12 කි.

## 9. පවත්වනු ලැබූ ජාතික උත්සව

- ස්වාභිමානී ජාතික සම්මාන ප්‍රදානෝත්සවය 2023.08.03 දින කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී.
- සංඥා භාෂා දිනය සැමරීම 2023.09.23 දින බත්තරමුල්ල සෙත්සිරිපාය පරිශ්‍රයේ දී පැවැත්විය. මෙහිදී ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින් සඳහා ජාත්‍යන්තර ධජයක් එළිදැක්වීම, සංඥා භාෂාවට අදාළ යූ ටියුබ් නාලිකාවක් සහ සංඥා භාෂා පරිවර්තකයන් සඳහා වෘත්තීය මූලධර්ම සහිත ආචාර ධර්ම පද්ධතියක් එළිදැක්වීම සිදුවිය.

## 10. දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම සඳහා 1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල් පනත යටතේ දෘශ්‍යාබාධිත පුනරුත්ථාන භාර අරමුදල පිහිටුවා ඇති අතර පහත වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇත.

- අ.පො.ස (සා.පෙළ), (උ.පෙළ), උපාධි හදාරන සිසුන් 341 ක් සඳහා මාසික දීමනා ගෙවීම.
- බ්‍රේල් සඟරා 9 ක් නිකුත් කිරීම.
- පුද්ගලයන් 3 දෙනෙකු සඳහා අක්ෂි කාච ලබාදීම.
- පුහුණුකරුවන් 03ක් සඳහා මාසික දීමනා ගෙවීම.

උක්ත වැඩසටහන් සඳහා මූල්‍ය වියදම රු.මිලියන 3.65 කි.

## 11. වෙනත් සංවර්ධන වැඩසටහන්

- ආබාධ සහිත ප්‍රජාව සඳහා රැකියා සහාය ප්‍රවර්ධනය සඳහා වන ව්‍යාපෘතිය (ESPD)

  ආබාධ සහිත රැකියා සොයන්නන් සඳහා පෞද්ගලික අංශයේ රැකියා සහාය ලබාදීම මූලික කර ගනිමින් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) හා සමාජ සේවා දෙපාර්තමේන්තුව එක්ව 2021 නොවැම්බර් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ පෞද්ගලික ආයතනයන් තුළ ආබාධ සහිත පුද්ගලයන් 98 දෙනෙකු සාර්ථක ලෙස රැකියාගත කිරීම සිදු කර ඇත.

- Child Fund ආයතනයේ සහාය ඇතිව නව වෘත්තීය පුහුණු පාඨමාලා 05ක් සඳහා විෂය නිර්දේශ සකස් කිරීම
- UN Women ආයතනය මගින් මනුසත් පියස කාන්තා රැකවරණ මධ්‍යස්ථානයේ මාස 06ක් සඳහා අවශ්‍ය වන ආහාර, සනීපාරක්ෂක, ප්‍රථමාධාර, ඇඳුම් හා ලිපිද්‍රව්‍ය සැපයීම
- ILO හා Automobile Council එක්ව කැටවල වෘත්තීය පුහුණු ආයතනයේ අභ්‍යාසලාභීන් රැකියාගත කිරීමට අදාළ මූලික සාකච්ඡා සිදු කරමින් පවතී.
- දිවයිනේ සියලුම මහ නගර සභා හා නගර සභා සීමාවන්හි සිටින යාචකයින් පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම සඳහා මූලික කටයුතු සිදු කරමින් පවතී.
- වෘත්තීය පුහුණු ආයතන 05ක් විශේෂීකරණය වූ ආයතන ලෙස සංවර්ධනය කිරීමට අදාළ මූලික කටයුතු ආරම්භ කිරීම

## 6.11 සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)

### හැඳින්වීම

සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය හරහා ග්‍රාමීය ජනතාව සෘජුව නිෂ්පාදන කාර්යයට සම්බන්ධ කර ගනිමින් ජාතික නිෂ්පාදනය වැඩි කිරීම පිණිස සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන හඳුන්වාදෙන ලද අතර එක් එක් ගම්මානයන්හි පවතින සම්පත් සුලභතාවය, නිෂ්පාදන විභවතාව, වෙළඳපොළ හා තිරසාරව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පදනම් කරගනිමින් , අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ සේවා සපයන ගම්මාන නිෂ්පාදන ගම්මාන ලෙස සංවර්ධනය කරනු ලබයි.

### කාර්යභාරය

ගෘහ ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කර ග්‍රාමීය ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නංවමින් ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමත්, දේශීය නිෂ්පාදන දිරිමත් කිරීම හා ප්‍රචලිත කිරීමත්, රැකියා අවස්ථා උදා කිරීම මගින් විරැකියාව අඩු කිරීමත්, ප්‍රධාන කාර්ය භාර්ය වේ.

### ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

#### i. භාණ්ඩාගාර ප්‍රතිපාදන සහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

2023.09.30 දිනට අනුමත කරන ලද ව්‍යාපෘති 58ක ප්‍රතිලාභීන් 3,692ක් සඳහා රු.මි 121.96 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කර ඇති අතර වියදම රු.මි 5.3 ක් වේ.

#### ii. භාණ්ඩාගාර ප්‍රතිපාදන රහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

- **නව ගම්මාන ඇති කිරීම**

විවිධ ආයතන මගින් ලබා දී ඌණ උපයෝජන වූ යන්ත්‍ර භාවිතයෙන් ප්‍රතිලාභීන් 60ක් සඳහා රජයේ ප්‍රතිපාදන භාවිතයෙන් තොරව නිමි ඇඳුම් නිෂ්පාදන ගම්මාන 2ක් ආරම්භ කරන ලදී.

- **පවතින ගම්මාන වැඩිදියුණු කිරීම**

වැඩිදියුණු කළ මුළු ගම්මාන ගණන 77ක් වන අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 3,396කි. ගම්මාන වල අත්‍යාවශ්‍ය වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා පහත සඳහන් ක්‍රමෝපායන් භාවිතා කරන ලදී.

### 1. අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්/ යෙදවුම් ලබාදීම

ව්‍යාපෘති 2ක ප්‍රතිලාභීන් 78කට නිෂ්පාදන කාර්යයන් සඳහා අත්‍යවශ්‍ය වන යටිතල පහසුකම් සහ යෙදවුම් ලබාදෙන ලදී.

### 2. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

නිෂ්පාදන ගම්මාන 29ක ප්‍රතිලාභීන් 263 ක් සඳහා ගැණුම්කරුවන් සම්බන්ධ කිරීම, ව්‍යවසාය ප්‍රවර්ධන වැඩසටහන් සඳහා යොමු කිරීම වැනි අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 3. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පසුගිය වසරවල ස්ථාපිත කරන ලද නිෂ්පාදන ගම්මාන 46 ක් ප්‍රතිලාභීන් 3095 ක් සඳහා 2023 වර්ෂය තුලදී විවිධ රාජ්‍ය ආයතන සම්බන්ධීකරණයෙන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මෙහිදී මූලිකවම ආකල්ප සංවර්ධනය හ ව්‍යාපාර සංවර්ධන ආශ්‍රිත පුහුණු වැඩසටහන් 30ක් ප්‍රතිලාභීන් 2254 ක් සඳහා පවත්වා ඇති අතර අගය එකතු කිරීම ඇතුළු තාක්ෂණික පුහුණු වැඩසටහන් 16ක් ප්‍රතිලාභීන් 841 ක් සඳහා පවත්වා ඇත.

# 6.12 ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSPD)

## හැඳින්වීම

ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති අතර, ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර පරිසරයක් උදාකර දීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීමේ අභිප්‍රායෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව මගින් ගන්නා වූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය මඟින් සිදුකරයි.

## කාර්යභාරය

- ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොඳ ජීවන තත්ත්වයක් ඇති කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සපයා ඔවුන් රැකබලා ගැනීමේ පහසුකම් සැලසීම සහ පුද්ගලයින් සඳහා පිහිටුවන ලද ආයතනවල කටයුතු මෙහෙයවීම, උපදෙස් දීම සහ ආධාර දීම
- භෞතික පරිසරය යෝග්‍ය පරිදි සැකසීම සඳහා වැඩසටහන් සහ ප්‍රතිපත්ති සකස් කිරීම හා මාර්ගෝපදේශ ලබා දීම
- ආබාධ ඇතිවීමේ ප්‍රධාන හේතු වැළැක්වීම සහ පාලනය කිරීම, පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ඇති කිරීම හා ප්‍රවර්ධනය

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 1. ආබාධ සහිත තැනැත්තන් සඳහා ආධාර ලබා දීම

- **ආධාරක උපකරණ**
  රු. මිලියන 8.54 ක් වැය කොට ජංගම සේවා 11 පවත්වා ඇති අතර ඒ යටතේ මූල්‍ය අනුග්‍රහ 7, අත්වාරු 6, ඇවිදීමේ ආධාරක උපකරණ 6, රෝද පුටු 13, කෘත්‍රිම පාද 10, ශ්‍රවණ උපකරණ 4, ඇස් කණ්ණාඩි 5,730, දුර සහ ළඟ පෙනෙන කණ්ණාඩි 13, හා විශේෂ පාවහන් 1 ලබා දී ඇත.
- **වෛද්‍ය ආධාර**
  රු. මිලියන 7.20 ක් වැය කොට ආබාධ සහිත පුද්ගලයන් 421 ක් සඳහා ආධාර ලබා දී ඇත.
- **අධ්‍යාපන ආධාර**
  රු. මිලියන 4.63ක් වැය කොට ආබාධ සහිත සිසුන් 419 ක් සඳහා ආධාර ලබා දී ඇත.
- **ස්වයං රැකියා ආධාර**
  රු. මිලියන 3.78 ක් වැය කොට ආබාධ සහිත පුද්ගලයන් 119 ක් සඳහා ආධාර ලබා දී ඇත.
- **රැකියා අවස්ථා ලබා දීම**
  මේ යටතේ රු. මිලියන 0.10 ක් වැය කොට ඇති අතර පුද්ගලයන් 1 ක් සඳහා වැටුපෙන් 50% ක් ගෙවීම සිදු කරනු ලබයි. එමෙන්ම පීසාහට් ආයතනය සඳහා පුද්ගලයන් 21 ක් රැකියා ගත කර ඇත.
- **වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාම ආධාර ලබාදීම**

  රු. මිලියන 5.25 ක් වැය කොට සේවකයින්ගේ වැටුප්, ජල හා විදුලි බිල්පත් ගෙවීම සිදු කොට ඇත.

- **නිවාස අධාර**
  සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමින් 5% ක් නිවාස අරමුදල සඳහා ප්‍රතිපාදන ලැබෙන අතර රු. මිලියන 12.94 ක් වැය කොට ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ඒකක 144 ක් සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.
- ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර යටතේ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ දැනුවත් කිරීම් සහ ප්‍රතිලාභ ලබාදීමේ වැඩසටහන් යටතේ රු. මිලියන 0.93 ක් වැය කොට වැඩසටහන් 11 ක් ක්‍රියාත්මක කිරීම.

## 2. මාසික දීමනාව ලබා දීම

- ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ලබාදෙන මාසික දීමනාව සඳහා රු. මිලියන 3,702.61 ක් වැය කොට නිත්‍ය ප්‍රතිලාභීන් 72,000 ක් අමතර ගෙවීම් 17,882 ක් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් 16,139 ක් සඳහා එම දීමනාව ලබා දී ඇත.

- වකුගඩු රෝගීන් වෙනුවෙන් ලබාදෙන මාසික දීමනාව ලබාදීම සඳහා රු. මිලියන 1,930.98 ක් වැය කොට නිත්‍ය ප්‍රතිලාභීන් 39,150 ක් අමතර ගෙවීම් 18,159 ක් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් 1,924 ක් සඳහා එම දීමනාව ලබා දී ඇත.

## 3. වෙනත් සංවර්ධන වැඩසටහන්

- ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරමින් පවතී.

# 6.13 වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSE)

## හැඳින්වීම

ශ්‍රී ලාංකික වැඩිහිටි ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ හා සංවර්ධනය කිරීමේ සුවිශේෂී අවස්ථාවක් ලෙස 2011 අංක 05 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය පිහිටුවීම සිදු කර ඇත.

## කාර්යභාරය

- වැඩිහිටියන්ට රැකවරණය, ආරක්ෂාව හා සුභසාධනය ලබාදීම පවුල තුළින්ම ඉටුකළ යුතු කාර්යභාරයක් බවට සමාජය දැනුවත් කිරීම.
- වැඩිහිටියන් රැක බලා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා වැඩි කිරීම.
- වැඩිහිටියන්ගේ හැකියාවන්, කුසලතා සංවර්ධනය මඟින් ආදායම් උත්පාදන මාර්ගයන්ට යොමු කරවීම.
- දැනුවත්භාවය වර්ධනය කිරීම තුළින් විශ්‍රාම දිවිය තුළ මුහුණ දෙන ගැටළු මඟහැරවීමට සූදානම් කිරීම.
- පිහිටක් අවැසි වැඩිහිටියන් සඳහා රැකවරණය සැලසීම.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 1. වැඩිහිටියන් සඳහා ආධාර ලබාදීම

- වැඩිහිටියන් 385 ක් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම - (වියදම රු. මිලියන 19.41)
- කිසිදු දීමනාවකට හිමිකම් නොකියන, නිදන්ගත බෝ නොවන රෝග වලින් පෙළෙන වැඩිහිටියන් සඳහා රුපියල් 25,000 බැගින් ලබාදෙන "ආරෝග්‍යා" වෛද්‍ය ආධාර වැඩසටහන යටතේ වැඩිහිටියන් 1,160 සඳහා ප්‍රතිලාභ ලබාදීම. – (වියදම රු.මිලියන 29.53)
- අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 822 ක් සඳහා ශ්‍රවණාධාර ලබාදීම. - (වියදම රු.මිලියන 22.59)
- අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 509 ක් සඳහා අක්ෂිකාච ලබාදීම. - (වියදම රු.මිලියන 3.61)
- වැඩිහිටි තැනැත්තන් 1,333 ක් සඳහා සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම - (වියදම රු. මිලියන 2.35)

මෙම වැඩසටහන් සඳහා වැඩිහිටි ආරක්ෂණ අරමුදල මඟින් ප්‍රතිපාදන සපයා ඇත.

### 2. වැඩිහිටි නිවාස සහ දිවාසුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම

- පන්නල “Welcome Villlage” වැඩිහිටි නිවාසයේ නඩත්තුව සහ පරිපාලනය - (වියදම රු.මිලියන 21.11)
- සරණ වැඩිහිටි නිවාසයේ පරිපාලනය. (දෙහිඅත්තකණ්ඩිය) - (වියදම රු. මිලියන 0.12)
- කතරගම වැඩිහිටි නිවාසයේ පරිපාලන කටයුතු. - (වියදම රු. මිලියන 0.86)
- කතරගම වැඩිහිටි නිවාසය ඉදිකිරීමේ කටයුතු - (වියදම රු.මිලියන 67.91/ භෞතික ප්‍රගතිය 48%)
- වැඩිහිටි නිවාස 19 ක් ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම - (වියදම රු. මිලියන 10.93)
- වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 16 ක් ඉදිකිරීම - (වියදම රු.මිලියන 45.75)
- වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 9 ක් සඳහා උපකරණ මිලදී ගැනීම - (වියදම රු.මිලියන 5.75)

මෙම වැඩසටහන් සඳහා වැඩිහිටි ආරක්ෂණ අරමුදල මඟින් ප්‍රතිපාදන සපයා ඇත.

## 3. වැඩිහිටියන් සඳහා මාසික දීමනා ලබාදීම

- වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටි දීමනාව ලබාදීම යටතේ නිත්‍ය ප්‍රතිලාභීන් - 416,667, අමතර ගෙවීම් - 217,995 සහ පොරොත්තු ලේඛනයේ සිටින - 94,791 දෙනෙකු සඳහා ගෙවීම් සිදුකර ඇත. (මූල්‍ය ප්‍රගතිය - රු.මිලියන 15,905.85)
- වයස අවුරුදු 100ට වැඩි වැඩිහිටි දීමනාව යටතේ නිත්‍ය ප්‍රතිලාභීන් 465 ක් සහ අමතර ගෙවීම් ප්‍රතිලාභින් - 239 දෙනෙකු සඳහා සිදුකර ඇත. (මූල්‍ය ප්‍රගතිය - රු.මිලියන 22.92)

## 4. වැඩිහිටි කමිටු බලගැන්වීම

- ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි කමිටු 421 ක් බලගැන්වීම - (වියදම රු.මිලියන 41.87)
- ජාතික වැඩිහිටි කමිටු බලමණ්ඩලය පිහිටුවීම. (වියදම රු.මිලියන 0.46)
- දිස්ත්‍රික් වැඩිහිටි කමිටු දැනුවත් කිරීමේ රැස්වීම් 1 පැවැත්වීම

## 5. වැඩිහිටියන් සඳහා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සැපයීම

- "දිරිය පියස"අඩු ආදායම්ලාභී වැඩිහිටි පුද්ගලයින් සඳහා නිවාස 49ක් ඉදි කිරීම/ අළුත්වැඩියා කිරීම - (වියදම රු.මිලියන 34.95)
- "සුව පහසු" මූල්‍යාධාර ක්‍රමය යටතේ වැඩිහිටියන් 1,784 සඳහා තමන්ගේම නිවෙස්වල ජීවත් වීමට අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම - (වියදම රු.මිලියන 93.25)

මෙම වැඩසටහන් සඳහා වැඩිහිටි ආරක්‍ෂණ අරමුදල මඟින් ප්‍රතිපාදන සපයා ඇත.

## 6. දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

- වැඩිහිටි නිවාසවල පාලකවරුන් 192 ක් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ වැඩිහිටියන් රැක බලාගැනීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම. - (වියදම රු.මිලියන 2.01)
- ග්‍රාමීය වැඩිහිටි කමිටු භාණ්ඩාගාරිකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළු 125 ක් පැවැත්වීම - (වියදම රු. මිලියන 3.70)
- වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ඩිජිටල් සාක්‍ෂරතා සහ වැඩිහිටි සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා යෝග අභිප්‍රේරණ වැඩසටහන් 21 ක් පැවැත්වීම - (වියදම රු. මිලියන 3.61)
- වැඩිහිටියන් සඳහා යෝග ව්‍යායාම සහ සරල ව්‍යායාම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම - (වියදම රු. මිලියන 1.33)
- විශ්‍රාම දිවිය පිළිබඳව පාසල් සිසුන් සහ විශ්‍රාම යාමට ආසන්න පුද්ගලයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 19 ක් පැවැත්වීම

මෙම වැඩසටහන් සඳහා වැඩිහිටි ආරක්‍ෂණ අරමුදල මඟින් ප්‍රතිපාදන සපයා ඇත.

## 7. ක්‍රියාත්මක කරන ලද වෙනත් සංවර්ධන වැඩසටහන්

- දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් 57 ක් පැවැත්වීම - (භාණ්ඩාගාර ප්‍රතිපාදන - රු.මිලියන 0.18 වැඩිහිටි ආරක්ෂණ අරමුදල - රු. මිලියන 1.09)
- වැඩිහිටි ආගමික චාරිකා 235 ක් සංවිධානය කිරීම - (වැඩිහිටි ආරක්ෂණ අරමුදල - රු.මිලියන 17.29)
- වැඩිහිටි හැඳුනුම්පත් 23,503 ක් නිකුත්කිරීම (භාණ්ඩාගාර ප්‍රතිපාදන - රු.මිලියන 0.37)
- වැඩිහිටි නඩත්තු මණ්ඩලයෙහි පැමිණිලි 100 ක් විසඳීම (භාණ්ඩාගාර ප්‍රතිපාදන - රු.මිලියන 1.20)
- ක්ෂේත්‍ර පරීක්‍ෂා 6ක් සිදුකිරීම (භාණ්ඩාගාර ප්‍රතිපාදන - රු.මිලියන 0.80)

# 6.14 ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)

## හැඳින්වීම

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මඟින් හා 1999 අංක 33 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධිත) පනත මඟින් ස්ථාපිතව ක්‍රියාත්මක වන ආයතනයකි. රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වේ.

## කාර්යභාරය

- ස්වයංරැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකට පත් වූ විට එම කාලයේ දී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
- ස්වයංරැකියාවල නියුතු තැනැත්තන් මියගියවිට, ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම.
- ස්වයංරැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාළ වෘත්තීන්වල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම.
- ස්වයං රැකියාවල යෙදෙන ලෙස තරුණයින් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම.
- සකසුරුවම් වීම හා සම්පත් කළමණාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### i. ස්වයංරැකියාවල නියුතු තැනැත්තන්ට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට ප්‍රතිලාභ ලබාදීම

- විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා සාමාජික 32,423ක් බඳවා ගෙන ඇති අතර එහි පළමු වාරික ලෙස රු. මිලියන 74.87ක් අයකර ගෙන ඇත.
- සාමාජිකයින් 34,717ක් සඳහා මාසිකව විශ්‍රාම වැටුප් ලෙස මේ දක්වා රු. මිලියන 303.34ක් ලබා දීම.
- සාමාජිකයින් (41) සඳහා මරණ පාරිතෝෂික, අර්ධ අබාධිත පාරිතෝෂික සහ පූර්ණ ආබාධිත මාසික දීමනා ලෙස රු. මිලියන 1.54 ක් ගෙවීම.
- සාමාජිකයින් 475ක් සඳහා අතිරේක ප්‍රතිලාභ (5 වසර ශිෂ්‍යත්ව, අ.පො.ස (සා/පෙළ), අ.පො.ස. (උ/පෙළ) ලෙස රු. මිලියන 5.119ක් ගෙවීම

### ii. ස්වයංරැකියාවල යෙදෙන ලෙස තරුණ ප්‍රජාව දිරිගැන්වීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම.

- තරුණ ප්‍රජාව ස්වයං රැකියා සඳහා යොමුවීම දිරිමත් කිරීම, පෙළඹවීම හා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සඳහා වෘත්තීය පුහුණු ආයතන හා ඒකාබද්ධව දැනුවත් කිරීම සහ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බඳවා ගැනීමේ වැඩසටහන් 12ක් වසර තුළ ක්‍රියාත්මක කරමින් පවතියි.

- සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුම හා අවශ්‍යතාව ප්‍රචලිත කිරීම, සම්පත් කළමනාකරණය, ව්‍යවසායකත්වය, යැපුම් මානසිකත්වයෙන් මිදීම, නිසි වෘත්තීය ගරුත්වය ලබාදීම වැනි තත්ත්වයන් පිළිබඳව පාසල් ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීමට දීප ව්‍යාප්ත වැඩසටහන් 50ක් ක්‍රියාවට නැංවීම.
- සමාජ ආරක්ෂණය සම්බන්ධ දැනුම ප්‍රචලිත කිරීමට, ඒ පිළිබඳ විෂය කරුණු පාසල් විෂයට ඇතුළත් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව කටයුතු කරන ලදී. ඒ අනුව යෝජිත නව පාසල් විෂයමාලා සංශෝධනයේදී, පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම සඳහා වූ සමාජ ආරක්ෂණය හා ස්වශක්තියෙන් නැගීසිටීමට අදාළ විෂය කරුණු "පුරවැසි අධ්‍යයනය" විෂයමාලා සංකල්ප රාමුවට ඇතුළත් කර ඇත.

**1. ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් ඔවුන්ගේ අදාළ වෘත්තීන්වල යෙදෙන ලෙස දිරිමත් කිරීම, සකසුරුවම්වීම හා සම්පත් කළමණාකරණයේ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීම**

- ස්වයංරැකියා සඳහා දිරිමත් කිරීම සහ ඒ සඳහා පවතින සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීම, සකසුරුවම් වීම හා සම්පත් කළමණාකරණය සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන් 2338 පැවැත්වීම.
- විශේෂ රැකියා ක්ෂේත්‍ර තුළ නිරතවුවන්ට ඔවුන්ගේ රැකියාවන්වල යෙදෙන ලෙස දිරිමත් කිරීම සඳහා විශේෂ ප්‍රතිලාභ සහිත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදුන් අතර ඒ අනුව නාවික ක්ෂේත්‍රය සඳහා "**"නාවිකයා"** සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය, විදේශ සේවා නියුක්තිකයින් සඳහා **"මනුසවි"** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ කලා ක්ෂේත්‍රය සඳහා **"කලාකරු"** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආදී යෝජනා ක්‍රමයන් ඔස්සේ පුද්ගලයින් 526ක් සඳහා විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ඔප්පු පිරිනැමීම.

# 6.15 ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

## හැඳින්වීම

1992 අංක 41 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත වූ මෙම ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 ඒ වගන්තිය යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇති අතර සමාජ වැඩ (Social Work) පිළිබඳව අධ්‍යාපනය ලබාදෙන ශ්‍රී ලංකාවේ ඇති එකම රාජ්‍ය ආයතනය වේ.
ආයතනයේ කේන්ද්‍රීය අංශය වන පාලක සභාව (Governing Council) මඟින් ආයතනයේ පරිපාලනය, කළමනාකරණය හා මූල්‍යමය කටයුතු සම්බන්ධව ක්‍රියාකරනු ලබයි. පාලක සභාව යටතේ ක්‍රියාත්මක අධ්‍යයන කටයුතු මණ්ඩලය (Academic Affairs Board) ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා වන උපදෙස් හා මග පෙන්වීම් ලබා දීම සිදු කරයි.

ආයතනයේ ක්‍රියාකාරී කටයුතු එකිනෙකට බද්ධ වූ අංශ 4 කින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒවා නම්,

1. සමාජ සේවා විද්‍යාලය
2. පුහුණු අංශය
3. සමාජ සංවර්ධන, ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
4. පරිපාලන හා මුදල් අංශය

## කාර්යභාරය

- සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස්කිරීම
- සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම.
- සමාජ සුභසාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳව අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම.
- සමාජ වැඩ වලදී තාක්ෂණය උපයෝගී කර ගැනීම ඇතුළුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිවයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදූව ප්‍රදේශයේ ඉදිකරනු ලබන ගොඩනැගිලි සංකීර්ණය

A හා B වශයෙන් කොටස් දෙකකින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම 2017.01.01 දින ආරම්භ කරන ලද අතර 2022 ඔක්තෝබර් මස අවසන් කිරීමට සැලසුම් කරන ලද නමුත් සැලසුම් කාල සීමාව දීර්ඝ කර ඇත.

මෙම ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 1000 ක් වන අතර 2017.01.01 සිට 2023.09.30 දක්වා රු.මිලියන 853.03ක මූල්‍යමය ප්‍රගතියක් අත්කරගෙන ඇත. A කොටසේ ඉදිකිරීම් අතුරින් 98.14% ක භෞතික ප්‍රගතියක් ද B කොටස සඳහා 100% ක ප්‍රගතියක් ද අත්කරගෙන ඇත.

## භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්

**i. උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා**

- සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි සිසුන් 871 ක් අධ්‍යයන කටයුතු සිදු කරනු ලබයි. (වියදම - රු.මිලියන 2.98)
- සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව හදාරණ සිසුන් 258 ක් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම. (වියදම - රු.මිලියන 1.08)
- උපදේශන ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සංශෝධිත යෝජනාව නැවත ඉදිරිපත් කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී.
- සමාජ වැඩ පර්යේෂණ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ විෂය මාලාව විෂයමාලා සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත්කොට ඇත.
- කාන්තා සවිබලකරණය පිළිබඳ ඩිප්ලෝමාවේ විෂය මාලාව විෂයමාලා සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත්කොට ඇත.
- සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ (2017/2018) උපාධි ප්‍රධානෝත්සවය පවත්වා ඇත.

**ii. පුහුණු වැඩසටහන්**

- අනෙකුත් දෙපාර්තමේන්තු වල ඉල්ලුම මත ක්‍රියාත්මක වන කෙටි කාලීන පුහුණු පාඨමාලා යටතේ වැඩසටහන් 20 ක් පවත්වා ඇත. (වියදම - රු. මිලියන 0.10)
- නියෝජිතායතන ක්ෂේත්‍ර සහ පිය අධීක්ෂකවරුන් සඳහා පුහුණු කිරීමේ කටයුතු වලට අදාලව වැඩසටහන් 02 ක් පවත්වා ඇත.
- කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. (100%)

**iii. පර්යේෂණ හා නිකුත් කරන ලද ප්‍රකාශන**

- සමාජ වැඩ පිළිබඳ ද්විවාර්ෂික ප්‍රකාශන නිකුත් කිරීම යටතේ සඟරා 04 සහ News letter 02 ක් ප්‍රකාශ කර ඇත. (වියදම - රු.මිලියන 0.10)
- සමාජ සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා විෂයමාලා සංවර්ධන ඉල්ලුම පිළිබඳ සමීක්ෂණ සිදු කරමින් පවතී. (60%)
- සමාජ වැඩ පිළිබඳ අන්තර් ජාතික සමුළුව සඳහා පත්‍රිකා සමාලෝචනය කරමින් පවතී. (70%)
- සමාජ ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශනය III ප්‍රකාශයට පත්කිරීම සඳහා මූලික කටයුතු සිදුකරමින් පවතී. (60%)

## මුදල් අයකරමින් ක්‍රියාත්මක කරන ලද පාඨමාලා/ පුහුණු වැඩසටහන්

**i. උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා**

- 2020/2021 කණ්ඩායමේ සිසුන් 57 ක් සඳහා උසස් පර්යේෂණ පුහුණුව පවත්වයි.
- 2021/2022 ශිෂ්‍ය කණ්ඩායමේ සිසුන් 83 ක් සඳහා පංතිකාමර දේශන පවත්වනු ලබයි.
- ප්‍රතිලාභීන් 623 ක් සඳහා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම. (වියදම - රු. මිලියන 2.48)
- ප්‍රතිලාභීන් 21 ක් සඳහා උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම. (වියදම - රු.මිලියන 0.81)
- සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව (MSW)2019/2020 අධ්‍යයන වර්ෂයේ (ඉංග්‍රීසි මාධ්‍ය) උපාධි ප්‍රදානෝත්සවය පවත්වා ඇත. (සිසුන් 08)

**ii. සහතික පත්‍ර පාඨමාලා**

- ප්‍රජා සංවර්ධනය (ළමා) පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා සිසුන් 500 ක් සහභාගීවී ඇත.

# 6.16 ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

## හැඳින්වීම

1974 වර්ෂයේ දී ආරම්භ වූ මෙම ආයතනය, 1978 වර්ෂයේ සිට ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමේ ක්‍රමෝපායක් ලෙස, සංවර්ධන ප්‍රවාහයෙන් ආන්තීකරණයට ලක් වූ දිළිඳු ප්‍රජාවගේ විභව ශක්තීන් මතු කරමින් ඔවුන්ගේ ස්වශක්තිය හා සාමූහිකත්වය වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව සංවර්ධන සංකල්පය මත පදනම් වූ විපර්යකාරක කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන තුළින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වාදුන් ජාතික ආයතනයකි. දිළිඳු ප්‍රජාවගේ සමාජ ආර්ථික ක්‍රියාවලිය තුළ ඔවුන් මුහුණපාන අවාසිදායක තත්ත්වය, වඩා වාසිදායක තත්වයක් බවට පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය බලගැන්වීමේ උත්ප්‍රේරණ ක්‍රියාවලිය මෙම ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරයකි.

## කාර්යභාරය

- ප්‍රජා සංවර්ධනය පිළිබඳ දැනුම කළමනාකරණය
- ප්‍රජා සංවර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළනැංවීම
- නවෝත්පාදන සංවර්ධන ප්‍රවේශයන් හඳුන්වාදීම

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### පර්යේෂණ, සමීක්ෂණ සහ අධ්‍යයන

- ප්‍රජාවගේ ආහාර අයිතීන් සුරක්ෂිත කිරීම සහ තෘප්තිය වැඩිකිරීම සඳහා පදික වෙළෙන්දන් පිළිබඳව කාර්බද්ධ පර්යේෂණයක් සිදුකරමින් පවතී.
- ව්‍යවසාය සංවර්ධන වැඩසටහන හරහා ප්‍රතිලාභී පවුල්වල ආර්ථිකයට සිදුවන බලපෑම පිළිබඳ සමීක්ෂණ වාර්තාව සකස් කරමින් පවතී.
- සෞභාග්‍යා ගම්මාන පිළිබඳ අධ්‍යයනය නිම කර ඇති අතර එයට අදාළ වාර්තා 20 ක් අමාත්‍යාංශයට ලබා දී ඇත.
- කාන්තාවන්ගේ ආර්ථික තත්වය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල කාර්ය භාරය පිළිබඳ සමීක්ෂණයෙන් රැස්කරගත් දත්ත විශ්ලේෂණය කරමින් පවතී.

### පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන්

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති නිලධාරීන් මැදිහත්කරුවන් ලෙස ගොඩනැඟීම සඳහා පුහුණු හා මැදිහත්වීම් වලට අදාළ පුහුණු වැඩසටහන් 06ක් පවත්වා ඇත.
- අඩු ආදායම්ලාභී පවුල්වල ව්‍යවසාය සංවර්ධන පුහුණු මැදිහත්වීම් සහ ගෘහ කළමණාකරණය පිළිබඳව ප්‍රවර්ධන වැඩසටහන් 01ක් පවත්වා ඇත.
- ආයතනයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 12ක් පවත්වා ඇත.

### ප්‍රකාශන

- ප්‍රජාශක්ති විද්‍යුත් සඟරාවෙහි පළමු වෙළුම වෙබ් අඩවියට මුදා හැර ඇති අතර දෙවන වෙළුමේ සංස්කරණ කටයුතු සිදු කරමින් පවතී.
- ආයතනයෙහි සංවර්ධන පුවත් විද්‍යුත් මාධ්‍ය වෙත බෙදා හැර ඇත.
- පුස්තකාලය සංවර්ධනය කිරීම යටතේ (SCAN) කරන ලද ලිපි 04ක් වෙබ් අඩවියට මුදා හැර ඇත.
- ආයතනයේ පහසුකම් පිළිබඳව සකස් කරන ලද අත් පත්‍රිකා 02ක් අන්තර්ජාලයට මුදා හැර ඇත.

## ක්‍රියාත්මකකරන ලද වෙනත් වැඩසටහන්

- ආයතනයේ සංවර්ධන කටයුතු වලට අදාළ ප්‍රගති සමාලෝචන රැස්වීම් 09ක් පවත්වා ඇත

## 2023 වසරේ ඉපයීම්

බොරැල්ල සහ පිළිමතලවේ මධ්‍යස්ථානයන්හි පිහිටි නේවාසිකාගාර හා දේශනශාලා බාහිර ආයතන වෙත ලබාදීම මඟින් රු.මිලියන 2.246 ක ආදායමක් ලබා ඇත.

# 6.17 උපදේශන අංශය

## හැඳින්වීම

ප්‍රජාව මුහුණපාන මානසික ගැටළුකාරී තත්වයන්, මානසික අසමතුලිතතා හා විවිධාකාර මනෝසමාජීය ගැටලු සඳහා, මනෝවිද්‍යාත්මක උපදේශන හා ප්‍රතිකාරාත්මක ක්‍රමවේද භාවිතා කරමින් මානසික යහපැවැත්ම ගොඩනැගීම මෙම අංශය මඟින් සිදු කරයි.

## කාර්යභාරය

- පුද්ගලයින් මුහුණපාන මානසික ගැටළුකාරී තත්වයන්, මානසික ආබාධ, මානසික ලෙඩ රෝග හා විවිධාකාර මනෝසමාජයීය ගැටළු හඳුනාගෙන එම තත්වයන් අවම කිරීමට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රජාව දැනුවත් කිරීමේ කණ්ඩායම් උපදේශන වැඩසටහන් සිදු කිරීම.
- ප්‍රජාව මානසිකව සවිබලගැන්වීම සඳහා මනෝවිද්‍යාත්මක උපදේශන මැදිහත්කරණය යොදාගනිමින් දැනුවත් කිරීමේ කණ්ඩායම් උපදේශන වැඩසටහන් පැවැත්වීම.
- මානසික ආබාධ හා මානසික ගැටළු සහිතව පැමිණෙන සේවාලාභීන් සඳහා ගුණාත්මක උපදේශන සේවා සපයමින් මානසික යහපැවැත්ම ගොඩනැංවීම.
- ජංගම දුරකථන උපදේශන සේවාව හරහා තනි පුද්ගල උපදේශන සේවා සැපයීම.
- සමාජ සංවේදීතාවය වඩාත් අවශ්‍යවන ප්‍රජා කණ්ඩායම් හඳුනාගෙන ඔවුන්ගේ මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේ උපදේශන වැඩසටහන් සිදු කිරීම.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2023.09.30 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

- මානසික රෝග, මානසික ගැටළුකාරී තත්වයන් හා විවිධ මනෝ සමාජයීය ගැටළු අවම කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රතිලාභීන් 256,162 ක් සඳහා උපදේශන වැඩසටහන් 6,183 ක් පැවැත්වීම.
- මානසික ආබාධ හා ගැටළුකාරී තත්වයන් සහිතව පැමිණි සේවාලාභීන් සඳහා තනිපුද්ගල උපදේශන සේවා සැසි 16,150 ක් පැවැත්වීම.
- ජංගම දුරකථන උපදේශන සේවය හරහා සේවාලාභීන්ගේ දුරකථන ඇමතුම් 2,986 ක් සඳහා සේවය සැපයීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් 22 ක් දිස්ත්‍රික්ක 22 ක් තුළ ක්‍රියාත්මක කිරීම (රු.මිලියන 0.498).
- ලෝක මානසික සෞඛ්‍ය දිනයට සමගාමීව අමාත්‍යාංශ මට්ටමින්,දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් රාජ්‍ය නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 24 ක් ප්‍රලාභීන් 1500කගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට නියමිතය.
- මනෝවිද්‍යා උපදේශන නිලධාරීන්, සංවර්ධන නිලධාරී (උපදේශන) සහ උපදේශන සහකාර නිලධාරීන් සඳහා මනෝවිද්‍යා උපදේශන ක්ෂේත්‍රයට අදාල පුහුණු වැඩසටහන් 04 ක් ආසියානු පදනමේ මූල්‍ය දායකත්වයෙන් පැවැත්වීම.
- ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන් (අධීක්ෂණ මට්ටම)සඳහා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් 09 ක් පැවැත්වීම.
- කන්දකාඩු, සේනපුර,වව්නියා මධ්‍යස්ථානවල අන්තරායකර ඖෂධවලට ඇබ්බැහිවූවන් සහ නොමඟ ගිය සටන්කරුවන් පුනරුත්ථාපනය සඳහා කණ්ඩායම් උපදේශන වැඩසටහන් 90 ක්(ප්‍රතිලාභීන් 610),යෝගා වැඩසටහන් 01 ක්(ප්‍රතිලාභීන් 40), ගී රසවින්දන වැඩසටහන් 01 ක් (ප්‍රතිලාභීන් 200) පැවැත්වීම.

- උපදේශන සේවා අවශ්‍යතා ඇති රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට උපදේශන නිලධාරීන්ගේ සේවය ලබාදීම (රෝහල්, බන්ධනාගාර, ළමා හා වැඩිහිටි නිවාස, ගුවන්සේවා සමාගම).

**බොහෝ වැඩසටහන් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කර ඇති අතර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වැය වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 0.65 කි.**

# 6.18 අනෙකුත් මෙහෙයුම් අංශ

## පාලන අංශය

අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සඳහා ආයතන රෙගුලාසි, චක්‍රලේඛ වලට අනුකූලව හා අවස්ථානුකූලව කටයුතු කිරිම සඳහා පාලන අංශය ක්‍රියාත්මක වේ. පාලන අංශය මඟින් පහත සඳහන් කාර්යයන් සිදුකරමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන හා අංශ වලට කාර්යක්ෂම සේවාවක් ලබාදෙයි.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් සියළුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාල ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම.
- දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම.
- අමාත්‍යාංශ විෂය පථයට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශ, පනත්, කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරිම මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම.
- අවශ්‍ය මානව සම්පත් හා යටිතල පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ඒ අනුව, මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ කුසලතා හා දැනුම වර්ධන පුහුණු වැඩසටහන් 5 ක් හා ආකල්ප වර්ධන පුහුණු වැඩසටහනක් පිළිවලින් නිලධාරීන් 299 ක් හා 107 ක් සහභාගීත්වයෙන් පවත්වන ලදී. එසේම තනි පුද්ගල පුහුණු වැඩසටහන් 9 ක් යටතේ නිලධාරීන් 66 දෙනෙක් යොමු කර ඇත. වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය අලුත් කිරීමට ඒක් නිලධාරියෙකු සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.

## සංවර්ධන අංශය

මෙම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු ආයතන හා අංශයන්හි අරමුණු ළඟාකර ගැනීම සඳහා උපදෙස් ලබාදීම, මඟ පෙන්වීම හා මෙහෙයවීම සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. තවද පහත සඳහන් විශේෂිත සංවර්ධන වැඩසටහන්හි අධික්ෂණ කටයුතු ද මෙම අංශය මඟින් ඉටු කර ඇත.

1) 2022/2023 වර්ෂයේ මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ සමෘද්ධි, ආබාධිත, වැඩිහිටි හා වකුගඩු දීමනාලාභීන් හා පොරොත්තුලේඛන ගත ප්‍රතිලාභීන් සඳහා මාර්තු සහ අප්‍රේල් මාසයන්හීදී, එක් පවුලකට සහල් කිලෝ 10 බැගින් ලබා දීමේ වැඩසටහන (සහල් මෙට්‍රික් ටොන් 177,129.2 4ක් ප්‍රතිලාභීන් 2,709,469 ක් අතර බෙදා දී ඇත.)
2) ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය අමාත්‍යාංශය තුළ පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත.

## ගිණුම් අංශය

මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිදභාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වා ගෙන යාම පැවරී ඇති අංශය ගිණුම් අංශය වේ.

අමාත්‍යාංශයට අදාළ ගිණුම් කටයුතු සහ සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අමතරව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩල වල ගිණුම් සුපරික්ෂණය සිදුකරනු ලැබේ.

## අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශ ලේකම් වෙත සෘජුවම වගකීමට බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන සේවාවන් හා වැඩසටහන් ගුණාත්මකව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය මූල්‍ය විගණනය , කාර්ය සාධන විගණනය, කළමනාකරණ විගණනය, පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවධානම් සහිත ක්ෂේත්‍ර පාදක කරගත් විගණනය සිදු කිරීම තුළින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ළඟාකරගැනීමට මඟපෙන්වීම් සිදු කිරීම කරනු ලබයි.

## සැලසුම් හා මෙහෙයුම් අංශය (සමාජ සවිබලගැන්වීම්)

සමාජ සවිබලගැන්වීම් අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ක්‍රියාත්මක වැඩසටහන් මෙහෙයවීම සහ ප්‍රගති පාලනය සහ අනෙකුත් රේඛිය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණ කිරීම සැලසුම් හා මෙහෙයුම් අංශය යටතේ සිදුවේ. තවද විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්හි සම්බන්ධිකරණ හා අධීක්ෂණ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරයි.

## 6.19 ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව වැඩසටහන් හා ව්‍යාපෘති

### නීති අණපනත් හා ක්‍රියාකාරී සැලසුම්වලට අදාල ඉදිරි කටයුතු

- අයාල ආඥා පනත හා නිවර්තන නිවාස පනත සංශෝධනය කිරීම
- අමාත්‍යාංශයේ ජාතික මට්ටමේ විවිධ දෙපාර්තමේන්තු/ ආයතන මඟින් ක්‍රියාවට නංවන සියළු වැඩසටහන් දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා බිම් මට්ටමේ දී ඒකාබද්ධ ප්‍රවේශයෙන් යුතුව ක්‍රියාවට නැංවීමට කටයුතු කරමින් පවුල් සවිබලගැන්වීමට ප්‍රතිපත්තියක් හඳුන්වාදීම
- ඒකාබද්ධ ක්‍රමවේදයකින් පවුල් සවිබලගැන්වීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ගික ක්‍රමවේදයක් සකස්කිරීම
- වැඩිහිටියන් සඳහා වන ප්‍රතිපත්තිය වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි සංශෝධනය කිරීම
- ස්වේච්ඡා කටයුතු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ ඉදිරි කටයුතු සිදුකිරීම
- තාවකාලික කාන්තා රැකවරණ නිවාස පවත්වාගෙනයාම පිළිබඳ මාර්ගෝපදේශය එළිදැක්වීම.
- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය හා ලිංගිකත්වය පදනම්කරගත් හිංසනය වැළැක්වීම සඳහා වන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම (2024 – 2028)
- කාන්තාව සාමය හා ආරක්ෂාව පදනම්කරගත් ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාත්මක නොවූ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම
- ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම, ළමුන්ට එරෙහි හිංසනය වැළැක්වීම, ළමා ආරක්ෂාව හා රැකවරණය වෙනුවෙන් නව ක්‍රමවේද හා ප්‍රවේශ දියත් කිරීම
- දැනට පවතින සාමාජීය ව්‍යුහයන් සවිබලගැන්වීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම හා නව ක්‍රමවේද හඳුන්වාදීම
- මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම සකස්කර ක්‍රියාවට නැංවීම

### අනෙකුත් වැඩසටහන් හා ව්‍යාපෘති

- “අස්වැසුම” සමාජ සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ හඳුනා ගන්නා ලද දුප්පත් හා අන්ත දිළිඳු පවුල් මිලියන 1.2 ක් 2024 - 2026 කාලය තුල සවිලබගැන්වීම.
- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ කිලිනොච්චි ආබාධිත පුද්ගලයින් සඳහා වන වෘත්තීය පුහුණු ආයතනයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම
- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ ආබාධ සහිත පුද්ගලයන් රැකවරණය සඳහා පුවක්පිටිය ආයතනයේ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම
- “ආබාධිත තත්ව අධ්‍යයනය” යන විෂය විශ්ව විද්‍යාල පද්ධතියට හා පාසල් පද්ධතියට හඳුන්වා දීම.
- ඒකාබද්ධ ප්‍රවේශයක් මඟින් දරුවන් හා වැඩිහිටියන් රැකබලාගැනීම සඳහා රැකියා උත්පාදන වැඩසටහන
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල සාමාජිකයින් සඳහා ලබාදෙන සේවාවන් වඩාත් කර්යක්ෂම කිරීම සඳහා නව පරිගණකගත විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සහ සාමාජිකයින්ගේ අයදුම්පත්‍ර ඇතුළු ලිපි ලේඛණ ඩිජිටල් ක්‍රමවේදයක් තුළට ඇතළත් කිරීම
- ජාතික සමාජ සංවර්ධන ආයතනය විශ්ව විද්‍යාලයක් බවට පත්කිරීමට අදාළ කටයුතු සිදු කිරීම
- ග්‍රාම සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කිරීම
- ආදර්ශ වැඩිහිටි නිවාසයක් කතරගම ආරම්භ කිරීම
- ළමයින් සඳහා වන විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම